**මුදල් කොමිෂන් සභාව**

*நிதி ஆணைக்குழு*

# Finance Commission

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (4) (අ) අනුව්‍යවස්ථාව ප්‍රකාරව
2026 වර්ෂය සඳහා

## ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ

*இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசின் அரசியலமைப்பின்*
*154ண உறுப்புரையின் (4) (அ) உப பிரிவின் பிரகாரம்*
*2026 ஆம் ஆண்டிற்காக*

## கௌரவ ஜனாதிபதி அவர்களுக்கு சமர்ப்பிக்கப்படும் பரிந்துரைகள்

## RECOMMENDATIONS SUBMITTED TO THE HON. PRESIDENT

In terms of Sub Article 4 (a) of Article 154R of the Constitution of the
Democratic Socialist Republic of Sri Lanka
for the year 2026

**2025 ඔක්තෝබර්**

**2025 ஒக்டோபர்**

**October 2025**

මුදල් කොමිෂන් සභාව
(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 "ජ" ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදී.)
நிதி ஆணைக்குழு
(அரசியலமைப்பின் 154 "ண" ஆம் உறுப்புரையின் கீழ் தாபிக்கப்பட்டது)
FINANCE COMMISSION
(Established under Article 154 "R" of the Constitution)

03, සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.
இல. 03, சரண மாவத்தை, ராஜகிரிய, இலங்கை.
03, Sarana Mawatha, Rajagiriya, Sri Lanka.

මගේ අංකය / எனது இல. / My No.: FC/PSR/07/01/2026

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2025.10.31

ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති
ජනාධිපති කාර්යාලය
කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (4)(අ) වන අනුව්‍යවස්ථාව අනුව 2026 වර්ෂය වෙනුවෙන් ජාතික අයවැයෙන් පළාත් සභා වෙත වෙන් කර දෙනු ලබන අරමුදල්, රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අත් කර ගැනීම අරමුණු කර ගෙන පළාත් අතර බෙදා දීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති පිළිබඳව ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කළයුතු මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මෙම වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ දැක්වේ. තවද, පළාත් සභා වෙත පැවරී ඇති කාර්යභාරය වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වනු පිණිස රජයේ සමස්ත සංවර්ධන උපායමාර්ගයට අනුපූරක වන පරිදි රජය විසින් ක්‍රියාත්මක කිරීම මැනැවැයි හැඟෙන නිර්දේශ කිහිපයක් මෙහි 05 වන පරිච්ඡේදයේ අන්තර්ගත වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව අනුව මුදල් කොමිෂන් සභාව විසින් එක් එක් පළාතේ අවශ්‍යතා සපුරාලීම සඳහා 2026 වර්ෂය වෙනුවෙන් ජාතික අයවැයෙන් එකී ආයතන වෙත ලබා දිය යුතු අරමුදල් පිළිබඳව මහා භාණ්ඩාගාරය වෙත 2025.08.14 දින ඉදිරිපත් කර ඇති නිර්දේශයන් ද මෙහි 3 වන පරිච්ඡේදයෙහි ඇතුළත් කර ඇත.

මෙම වාර්තාව ඔබ තුමාගේ කාරුණික අවධානය සඳහා ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී,

සුමිත් අබේසිංහ
සභාපති
මුදල් කොමිෂන් සභාව

සභාපති / தலைவர் / Chairman (+94)011 2866724 | ලේකම් / செயலாளர் / Secretary (+94)011 2866824 | කාර්යාලය / அலுவலகம் / Office (+94)011 2866747 | ෆැක්ස් / தொலைநகல் / Fax (+94)011 2866671, (+94)011 2866679 | විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail info@fincom.gov.lk
www.fincom.gov.lk

# මුදල් කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (4) (අ) අනුව්‍යවස්ථාව ප්‍රකාරව

2026 වර්ෂය සඳහා

## ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ

**2025 ඔක්තෝබර්**

# පටුන

**අන්තර්ගතය** **පිටු අංකය**


| | |
|---|---|
| 01. හැඳින්වීම | 01 - 02 |
| 02. පළාත් සභා වෙත අරමුදල් ලබා දීම | 03 - 08 |
| 03. 2026 වර්ෂය සඳහා පළාත් ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් අවශ්‍යතා තක්සේරු කිරීම | 09 - 18 |
| 04. 2026 වර්ෂය සඳහා පළාත් සභා අතර රජයේ ප්‍රදාන වෙන් කර දීම පිළිබඳ නිර්දේශ | 19 - 26 |
| 05. විශේෂ නිර්දේශ | 27 - 35 |


**ඇමුණුම්**


ඇමුණුම I: අපේක්ෂිත ආදායම් ඉලක්කයෙන් 50% ගැළපීමෙන් පසුව නිර්දේශිත පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන පළාත් අතර බෙදා වෙන් කිරීම - 2026

ඇමුණුම II: 2026 වර්ෂයේ පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා යොමු කර ඇති මාර්ගෝපදේශ - බස්නාහිර පළාත

# 1 වන පරිච්ඡේදය

## හැඳින්වීම

### 1.1 පසුබිම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (4) (අ) අනුව්‍යවස්ථාව ප්‍රකාරව ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන මෙම වාර්තාවෙහි, 2026 වර්ෂය සඳහා ආණ්ඩුව විසින් වාර්ෂික අයවැයෙන් පළාත්වලට ප්‍රදානය කරනු ලබන අරමුදල්, පළාත් අතර බෙදා දීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති ඇතුළත් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාව අනුව, රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අත් කර ගැනීම අරමුණු කර ගනිමින් එම ප්‍රතිපත්ති පිළියෙළ කර ඇත. එසේම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව අනුව, රජය විසින් පළාත් සභා සඳහා අරමුදල් වෙන්කර දීම පහසු කරලීම සඳහා පළාත් සභාවන්හි අවශ්‍යතා සපුරාලීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් අරමුදල් පිළිබඳව දැනටමත් රජයට ඉදිරිපත් කරන ලද නිර්දේශ ද මෙහි අන්තර්ගත වේ. පළාත් සභා වෙත පැවරී ඇති විෂයයන්ට අදාළ සේවා වඩාත් කාර්යක්ෂමව සැපයීම සඳහාත්, තුලිත ප්‍රාදේශීය සංවර්ධනය ළඟා කර ගැනීමේ පළාත් සභා ප්‍රයත්නය සාර්ථක කර ගැනීම සඳහාත් තිබිය යුතු රජයේ මැදිහත්වීම් සම්බන්ධයෙන් වූ නිර්දේශ කිහිපයක් මෙහි 5 වන පරිච්ඡේදයේ ඇතුළත් වේ.

### 1.2 මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කිරීම සහ එහි ව්‍යවස්ථාපිත කාර්යභාරය

බලතල විමධ්‍යගත කිරීම මගින් පළාත් සභා ස්ථාපිත කිරීම සඳහා 1987 දී සම්මත කරනු ලැබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 13 වන සංශෝධනය මගින් මුදල් කොමිෂන් සභාවද ස්ථාපිත කරනු ලැබ ඇත. එහිදී රටෙහි සමස්ථ භූමි ප්‍රමාණය පළාත් සභා මගින් පරිපාලනය වන ලෙස පළාත් නවයකට බෙදන ලදී. මෙම සංදර්භය තුළ, රජයේ වාර්ෂික අයවැයෙන් පළාත්වල අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සපයා දීම සහ ප්‍රාදේශීය විෂමතාවයන් අවම කරගැනීම තුළින් තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කරගැනීම අරමුණු කර ගනිමින් එම අරමුදල් සාධාරණ ලෙස පළාත් අතර බෙදා දීම පහසුකරලීම පිණිස මුදල් කොමිෂන් සභාව පිහිටුවා ඇත. එහිදී, පළාත්වල අවශ්‍යතා සපුරාගැනීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් රජය වෙත නිර්දේශ ඉදිරිපත් කරන අතර, මුදල් කොමිෂන් සභාව විමසා රජය විසින් එම අරමුදල් සැපයිය යුතුව ඇත.

එසේම, ඉහත පරිදි පළාත්වල අවශ්‍යතා සඳහා රජයේ වාර්ෂික අයවැයෙන් ප්‍රදානය කරනු ලබන අරමුදල් ප්‍රාදේශීය විෂමතාවයන් අවම වන පරිදි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණ සහිතව පළාත් අතර බෙදා දීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති පිළිබඳව ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම මුදල් කොමිෂන් සභාවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති ප්‍රමුඛ කාර්යභාරයකි. තවද, පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් මුදල් කොමිෂන් සභාවට යොමු කරනු ලබන වෙනත් යම් කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද කොමිෂන් සභාවෙහි කාර්යභාරයක් වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154ජ (3), (4) සහ (5) අනුව්‍යවස්ථාවල දැක්වෙන පරිදි මුදල් කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යභාරය පහත පරිදි දැක්වේ;

**154ජ (3) අනුව්‍යවස්ථාව:** පළාතේ අවශ්‍යතා සපුරාලීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් අරමුදල්, ආණ්ඩුව විසින් කොමිෂන් සභාවේ නිර්දේශ අනුව සහ කොමිෂන් සභාව විමසා වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන් කර දිය යුත්තේය.

**154ජ (4) අනුව්‍යවස්ථාව:**

(අ) පළාත් සඳහා ආණ්ඩුව විසින් වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදා දීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති; සහ

(ආ) පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවට යොමු කරන ලද වෙනත් යම් කාරණයක්, සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම කොමිෂන් සභාවේ කාර්යය වන්නේය.

**154ජ (5) අනුව්‍යවස්ථාව:** රට තුළ ප්‍රාදේශීය සංවර්ධනයක් අත් කර ගැනීම අරමුණු කර කොමිෂන් සභාව විසින් ඒ ප්‍රතිපත්ති පිළියෙළ කළ යුතු අතර ඒ අනුව -

(අ) එක් එක් පළාතේ ජන සංඛ්‍යාව;
(ආ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම;
(ඇ) විවිධ පළාත් අතර ආර්ථික විෂමතා අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාව; සහ
(ඈ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම සහ පළාත් අතර වැඩිම ඒක පුද්ගල ආදායම අතර වෙනස අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාවය, සැලකිල්ලට ගත යුත්තේය.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (7) අනුව්‍යවස්ථාව අනුව, එම ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම නිර්දේශයක් ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ජනාධිපතිවරයා විසින් කටයුතු සැලැස්විය යුතු අතර, ඒ නිර්දේශ මත ගනු ලැබූ ක්‍රියා කවරේදැයි පාර්ලිමේන්තුවට දැනුම් දිය යුත්තේය.

## 1.3 මුදල් කොමිෂන් සභාව විසින් ඉටු කරනු ලබන කාර්යයන්

ඉහත 1.2 ඡේදයේ සඳහන් කෙරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව, පළාත්වල අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් අරමුදල් වාර්ෂික අයවැයෙන් වෙන් කර දීම පිළිබඳව ආණ්ඩුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සහ රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණින් එම අරමුදල් පළාත් අතර බෙදා දීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති පිළිබඳව හා පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවට යොමු කරන ලද වෙනත් යම් කාරණයක් වෙතොත් ඒ සම්බන්ධයෙන් නිර්දේශ ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම මුදල් කොමිෂන් සභාවේ මූලික කාර්යභාරය වේ.

ඉහත ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීමේදී මුදල් කොමිෂන් සභාව විසින් පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලැබේ.

i. පළාත්වල වාර්ෂික ප්‍රාග්ධන සහ පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීමේ කාර්යය සඳහා තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පළාත් සභා වෙත මාර්ගෝපදේශ නිකුත් කිරීම.

ii. පළාත්වල ප්‍රාග්ධන සහ පුනරාවර්තන අවශ්‍යතා අධ්‍යයනය කර පළාත් බලධාරීන් සමග සවිස්තරාත්මකව සාකච්ඡා කිරීමෙන් අනතුරුව එකී අවශ්‍යතා තක්සේරු කිරීම.

iii. පළාත්වල අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය ප්‍රමාණවත් අරමුදල් වාර්ෂික අයවැයෙන් වෙන් කර දීම සඳහා රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම

iv. පළාත්වල අවශ්‍යතා සඳහා රජය විසින් ලබා දෙන අරමුදල් පළාත් නවය අතර බෙදා දීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති පිළිබඳව ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

v. වාර්ෂික අයවැයෙන් වෙන් කර දෙනු ලබන අරමුදල් පළාත් අතර බෙදා දීම සහ පළාත් තුළ විවිධ අංශ සඳහා වෙන් කර දීම.

vi. වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස අරමුදල් භාවිතා කිරීමේ අභිලාශයෙන් යුතුව පළාත් වාර්ෂික සංවර්ධන සැලැසුම් සකස් කිරීමට අදාළව මාර්ගෝපදේශ නිකුත් කිරීම.

vii. අදාළ සියළු පාර්ශ්වයන්ගේ සහභාගීත්වයෙන් පළාත් වාර්ෂික සංවර්ධන සැලැසුම් සමාලෝචනය කිරීම සහ අවශ්‍ය යැයි හැඟෙන සංශෝධනයන්ට යටත්ව එම සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාවය ලබා දීම.

viii. පළාත් සේවක සංඛ්‍යාව කළමනාකරණය සම්බන්ධයෙන් ආණ්ඩුවට නිර්දේශ සැපයීම.

# 2 වන පරිච්ඡේදය

## පළාත් සභා වෙත අරමුදල් ලබා දීම

### 2.1 බලතල බෙදීමේ රාමුව තුළ පළාත්වල මූල්‍ය අවශ්‍යතා සපුරාලීම

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වැනි සංශෝධනය මගින් 1987 දී පළාත් සභා ක්‍රමය හඳුන්වාදීමත් සමඟ, රටෙහි දේශපාලන හා පරිපාලන ව්‍යුහයේ විශාල වෙනසක් ඇති විය. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ රජය (මධ්‍යම), පළාත් සභා සහ පළාත් පාලන ආයතන යන පැහැදිලි පාලන ස්ථර තුනක් නිර්මාණය විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වැනි සංශෝධනයට සමගාමීව, පළාත් සභාවල ක්‍රියාකාරිත්වය පහසු කිරීම සඳහා 1987 අංක 42 දරන පළාත් සභා පනත පනවන ලදි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වැනි සංශෝධනයට අනුව, පළාත් සභා විසින් ක්‍රියාත්මක කළ යුතු ව්‍යවස්ථාදායක, විධායක සහ මූල්‍ය බලතල සීමාවන් තීරණය වූ විමධ්‍යගත පාලනයක් ස්ථාපිත විය. මධ්‍යම රජය සහ පළාත් අතර බෙදුණු බලතලවල විෂය අන්තර්ගතය, එහි 9 වන උපලේඛනයේ ලැයිස්තු 3ක් ලෙස දක්වා ඇත. ඒ අනුව, පළාත් සභා වෙත පවරා ඇති බලතල පළාත් සභා ලැයිස්තුව ලෙසද රජය සතු බලතල සංවෘත ලැයිස්තුව ලෙසද රජය සහ පළාත් සභා හවුලේ වගකීම් දරන විෂයයන් සමගාමී ලැයිස්තුව ලෙසද දැක්වේ.

පළාත් සභා විසින් ඍජුවම එකතු කරනු ලබන ආදායම්වල ප්‍රභවයන් පිළිබඳ තොරතුරු ද පළාත් සභා ලැයිස්තුවෙහි සඳහන් කර ඇත. පළාත් සභා විසින් එකතු කරනු ලබන ආදායම පළාත් සභාවේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා යොදා ගනු ඇතැයි අපේක්ෂා කළ ද, එම ආදායම පළාත් සභාවල සමස්ත මූල්‍ය අවශ්‍යතාවය සැලකූ විට ඉතා කුඩා ප්‍රමාණයකි. එම නිසා, බාධාවකින් තොරව පළාත් සභාවල සේවාවන් ලබා දීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් ප්‍රතිපාදන අයවැයෙන් වෙන් කර දිය යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කර ඇත.

පළාත් පාලන ආයතන තුන්වන සහ පහළම පාලන ස්ථරය වන අතර, එය මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන එකිනෙකට වෙනස් නෛතික ආයතන තුනකින් සමන්විත වේ. මෙම ආයතන පිළිවෙලින් 1947 අංක 16 දරන මහ නගර සභා ආඥාපනත, 1939 අංක 61 දරන නගර සභා ආඥා පනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පිහිටුවා ඇත. සෑම පළාත් පාලන ආයතනයකටම නීති සම්පාදනය කිරීමට සහ එහි මෙහෙයුම් කටයුතු සඳහා සහාය වීමට අරමුදලක් පවත්වාගෙන යාමට බලය පැවරී ඇත. මෙම පළාත් පාලන ආයතනවල ප්‍රධාන වගකීම් අතරට පළාත් පාලන මාර්ග ඉදිකිරීම සහ නඩත්තු කිරීම, ප්‍රජා ජල සම්පාදනය, කසළ කළමනාකරණය සහ එම පළාත් පාලන ප්‍රදේශයෙහි වාසය කරන ජනතාවගේ යහපැවැත්ම ඉහළ නැංවීම අරමුණු කර ගත් විවිධ සමාජ සේවා වැනි අත්‍යවශ්‍ය ප්‍රාදේශීය පොදු සේවාවන් සැපයීම ද ඇතුළත් වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය බලාත්මක කිරීමෙන් අනතුරුව, පළාත් පාලන ආයතන අධීක්ෂණය කිරීමේ වගකීම අදාළ පළාත් සභාවලට පැවරුණි. ආදායම් උත්පාදනය කිරීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන ආයතනවලට බලය තිබුණ ද, ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාගැනීමට තරම් ආදායම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම ආයතනවල සේවකයින්ගේ වැටුප් හා නියෝජිතයන්ගේ දීමනා සඳහා රජය විසින් අරමුදල් ලබාදීම සිදු කෙරේ. කෙසේ වුවද, රජය විසින් මහ නගර සභා සඳහා මෙසේ සපයනු ලබන අරමුදල් 2024 සිට පුද්ගල පඩිනඩි සඳහා වන පිරිවැයෙන් 80% කට සීමා කරන ලද අතර 2025 දී මහ නගර සභා සඳහා 60% ලෙසද නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා 80% ලෙසද සීමා කරන ලද්දේ එකී ආයතනවල ආදායම වැඩිකර ගැනීමට පෙළඹවීමේ අදහසිනි.

## 2.2 පළාත් සභා වෙත අරමුදල් ලබා දීමේදී මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව රජය විසින් පළාත් සභාවල මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් අරමුදල් ලබාදිය යුතු අතර, දිවයිනේ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් එම අරමුදල් පළාත් අතර තාර්කික ක්‍රමවේදයකට බෙදා දිය යුතුය. ඒ අනුව, මුදල් කොමිෂන් සභාව මේ සම්බන්ධයෙන් ද්විත්ව කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

### i. පළාත් අවශ්‍යතා විශ්ලේෂණය කිරීම

ශ්‍රී ලංකාවේ වර්තමාන ජාතික ප්‍රතිපත්ති රාමුව, චක්‍රලේඛ, විධිවිධාන, තිරසර සංවර්ධන අභිමතාර්ථ, ජාතික හා පළාත් ප්‍රමුඛතා ආදිය සැලකිල්ලට ගනිමින් පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රාග්ධන සහ පුනරාවර්තන මූල්‍ය අවශ්‍යතා විශ්ලේෂණය කිරීමෙන් පසු මුදල් කොමිෂන් සභාව පළාත් මූල්‍ය අවශ්‍යතා නිර්ණය කරනු ලැබේ.

මෙම පළාත් අවශ්‍යතා තක්සේරු කිරීමේදී, කොමිෂන් සභාව පළාත් සඳහා ලබා දෙනු ලබන ආකෘති සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම, මාර්ගෝපදේශ සහ උපදෙස් ලබා දීම ද ඇතුළත්ව පුළුල් ක්‍රියාවලියක නිරත වේ. තවද, කොමිෂන් සභාව විසින් වාර්ෂික මුළු පළාත් අවශ්‍යතාවය පිළිබඳව පළාත් සභා නිලධාරීන් හා ජාතික මට්ටමේ ආයතනවල නිලධාරීන් සමඟ දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කර සියළුම පළාත් සඳහා වූ සමස්ත අයවැය අවශ්‍යතාවය සකස් කර භාණ්ඩාගාරයට නිර්දේශ කරනු ලැබේ.

### ii. තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් එම අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් සකස් කිරීම

ජාතික අයවැයෙන් වෙන් කරනු ලබන අරමුදල් පළාත් අතර තර්කානුකූල පදනමක් මත වෙන් කිරීමේ ප්‍රතිපත්ති මුදල් කොමිෂන් සභාව විසින් සකස් කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් මෙම වාර්තාවේ 4 වන පරිච්ඡේදය මගින් වැඩි දුරටත් සාකච්ඡා කෙරේ. මෙම කාර්යයේ අරමුණ වනුයේ, පළාතේ සමාජ ආර්ථික තත්ත්වය මත පදනම්ව සෑම පළාතකටම සාධාරණ ලෙස අරමුදල් ලැබෙන බවට සහතික කර ගැනීමයි.

පළාත් සභාවල මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් ජාතික අයවැයෙන් අරමුදල් වෙන් කිරීම සඳහා පහත සඳහන් විවිධ ප්‍රදානයන් වශයෙන් අරමුදල් ලබාදීම මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබේ.

### 2.2.1 සාමූහික ප්‍රදාන (Block Grant)

පළාත් සේවා සැපයුම් පද්ධතිය අඛණ්ඩව පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීමට අවශ්‍ය වියදම් දැරීම සඳහා දෙනු ලබන පුනරාවර්තන අරමුදල් සාමූහික ප්‍රදානය ලෙස හැඳින්වේ. රාජ්‍ය සේවයේ කාර්යමණ්ඩලවල වැඩි පිරිසක් පළාත් අධ්‍යාපන හා පළාත් සෞඛ්‍ය අංශවල නියුක්ත වීම හේතුවෙන් පළාත් රාජ්‍ය සේවයේ කාර්යමණ්ඩල සඳහා වන පුද්ගල පඩිනඩි, සාමූහික ප්‍රදානවල ප්‍රධාන සංරචකය වේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්යමණ්ඩල සඳහා පමණක් වැටුප් හා වේතන තක්සේරු කරනු ලබන අතර, මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද පුළුල් අවශ්‍යතා තක්සේරුවකින් පසු පළාත් සභා සඳහා අවශ්‍ය අරමුදල් නිර්දේශ කරනු ලැබේ. ඊට අමතරව, පළාත් පාලන ආයතනවලට අරමුදල් මාරු කිරීම්, පාසල් ආහාර පෝෂණ වැඩසටහන, නඩත්තු වියදම්, සමාජ සුබසාධක වියදම්, ගමන් වියදම්, සැපයුම්, ගිවිසුම්ගත සේවා ආදිය සඳහා වන වියදම් ද සාමූහික ප්‍රදාන යටතට ඇතුළත් වේ.

### 2.2.2 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG)

පළාත් සභාවලට පැවරී ඇති විෂයයන්ට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, ප්‍රාග්ධන ස්වභාවයේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා පළාත් සභා වෙත පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) ලබාදෙනු ලැබේ. මුදල් කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලබන

මාර්ගෝපදේශවලට අනුව, වෙන් කරන ලද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මත පදනම්ව පළාත් සභා විසින් සෑම වර්ෂයක් සඳහාම සංවර්ධන සැලැස්මක් සකස් කෙරේ. පළාත් බලධාරීන් හා මහා භාණ්ඩාගාරය ඇතුළු අදාළ අනෙකුත් ආයතනවල නියෝජිතයින්ද සමඟ එම සැලසුම් සමාලෝචනය කර අත්‍යාවශ්‍ය සංශෝධනවලට යටත්ව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්තිමය එකඟතාවය මුදල් කොමිෂන් සභාව විසින් පළ කෙරේ.

පළාත් සංවර්ධන සැලසුම් ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූල විය යුතු අතර, පළාතේ මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්ම තුළ හඳුනාගෙන ඇති පළාත් අවශ්‍යතා සහ ප්‍රමුඛතා ද සැලකිල්ලට ගනිමින් සකස් කළ යුතුවේ. මෙකී සැලසුම් ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ප්‍රතිඵල ඇගයීම පහසු වන පරිදි මෙම සැලැස්මෙහි ඇතුළත් සෑම ආයෝජනයක් සඳහාම ප්‍රතිඵල පාදක මෙහෙයුම්කරණ හා ඇගයීම් ක්‍රමවේදයක් අනුගමනය කරමින් මැනිය හැකි නිමැවුම් හා ප්‍රතිඵල අර්ථ දැක්වෙන පරිදි කාර්යසාධන දර්ශක සකස් කළ යුතුය. (2026 වර්ෂයට අදාළව පළාත් සභා විසින් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කළ යුතු ආකාරය පිළිබඳව මුදල් කොමිෂන් සභාව විසින් ලබා දුන් මාර්ගෝපදේශ අඩංගු 2025.10.07 දිනැති ලිපිය මෙම වාර්තාවේ ඇමුණුම II හි දැක්වේ).

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ලෙස  පළාතට වෙන් කරන ප්‍රතිපාදනයෙන් කොටසක් (5%-10%ත් අතර) නම්‍යශීලී අරමුදල ලෙස වෙන් කරනු ලබන අතර මෙම ප්‍රතිපාදනය පළාතේ එක් එක් අංශය සඳහා සකස් කරනු ලබන වාර්ෂික සැලැස්මෙන් ආවරණය නොවන පළාතේ ජනතාවගේ ප්‍රමුඛ සංවර්ධන හිඩැස් පිරවීමට හා නව රැකියා බිහි කිරීම හා ආදායම් උත්පාදනය මගින් ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට දායක වන ආර්ථික වශයෙන් ශක්‍යතාවයක් සහිත විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදා ගනු ලැබේ.

2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාල සීමාව තුළ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මහා භාණ්ඩාගාරය විසින් පළාත් සභා වෙත ජාතික අයවැය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය, නිදහස් කරන ලද අක්මුදල් ප්‍රමාණයන් සහ 2025 වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය පහත වගු අංක 01 හි දක්වා ඇති අතර 2023, 2024 සහ 2025 වර්ෂ සඳහා එක් එක් අංශය අනුව වෙන්කරන ලද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) ප්‍රමාණය පහත වගු අංක 02 හි දක්වා ඇත.

වගුව **01:** පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා  වාර්ෂික අයවැය මගින් වෙන් කරන ලද  ප්‍රතිපාදන හා නිදහස් කරන ලද අක්මුදල් ප්‍රමාණය **(2022-2025)**

**(රු. මි.)**

| වර්ෂය / පළාත | 2022 | | | 2023 | | | 2024 | | | 2025 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අයවැය මගින් වෙන් කිරීම | නිදහස් කරන ලද අක්මුදල | % | අයවැය මගින් වෙන් කිරීම | නිදහස් කරන ලද අක්මුදල | % | අයවැය මගින් වෙන් කිරීම | නිදහස් කරන ලද අක්මුදල | % | අයවැය මගින් වෙන් කිරීම |
| බස්නාහිර | 836.00 | 418.00 | 50 | 1,261.00 | 641.65 | 51 | 1,685.00 | 1,179.50 | 70 | 5,894.00 |
| මධ්‍යම | 1,040.00 | 520.00 | 50 | 1,889.00 | 961.15 | 51 | 2,743.00 | 1,920.10 | 70 | 7,360.00 |
| දකුණු | 971.00 | 485.50 | 50 | 1,620.00 | 825.20 | 51 | 2,472.00 | 1,854.00 | 75 | 6,976.00 |
| උතුරු | 1,243.00 | 621.50 | 50 | 2,190.00 | 1,114.30 | 51 | 3,305.00 | 2,313.50 | 70 | 7,328.00 |
| වයඹ | 1,012.00 | 506.00 | 50 | 1,708.00 | 869.05 | 51 | 2,423.00 | 1,817.25 | 75 | 6,835.00 |
| උතුරුමැද | 1,227.00 | 613.50 | 50 | 1,946.00 | 990.15 | 51 | 2,894.00 | 1,848.40 | 64 | 7,014.00 |
| ඌව | 1,250.00 | 625.00 | 50 | 2,093.00 | 1,064.95 | 51 | 3,169.00 | 2,376.75 | 75 | 7,688.00 |
| සබරගමුව | 1,132.00 | 566.00 | 50 | 2,037.00 | 1,036.81 | 51 | 3,039.00 | 2,127.30 | 70 | 7,584.00 |
| නැගෙනහිර | 1,400.00 | 700.00 | 50 | 2,156.00 | 1,097.05 | 51 | 3,270.00 | 2,452.50 | 75 | 7,321.00 |
| **එකතුව** | **10,111.00** | **5,055.50** | **50** | **16,900.00** | **8,600.31** | **51** | **25,000.00** | **17,889.30** | **72** | **64,000.00** |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

වගුව 02: අංශ අනුව වෙන් කරන ලද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රමාණය (2023-2025)

(රු. මි.)

| අංශය | 2023 | | 2024 | | 2025 | |
|---|---|---|---|---|---|---|
| | වෙන් කළ මුදල | % | වෙන් කළ මුදල | % | වෙන් කළ මුදල* | % |
| **සමාජ යටිතල පහසුකම්** | **6,554** | **38.78** | **9,729** | **38.92** | **25,334** | **39.58** |
| අධ්‍යාපනය | 2,620 | 15.50 | 3,890 | 15.56 | 9,101 | 14.22 |
| සෞඛ්‍යය | 2,000 | 11.83 | 3,001 | 12.00 | 7,953 | 12.43 |
| දේශීය වෛද්‍ය | 549 | 3.25 | 793 | 3.17 | 1,958 | 3.06 |
| ක්‍රීඩා | 175 | 1.04 | 263 | 1.05 | 911 | 1.42 |
| පරිවාස හා ළමාරක්ෂක | 494 | 2.92 | 710 | 2.84 | 2,063 | 3.22 |
| සමාජ සේවා | 362 | 2.14 | 526 | 2.10 | 1,303 | 2.03 |
| සංස්කෘතික කටයුතු | 98 | 0.58 | 149 | 0.60 | 521 | 0.81 |
| නිවාස | 154 | 0.91 | 222 | 0.89 | 722 | 1.13 |
| සමුපකාර | 51 | 0.30 | 83 | 0.33 | 293 | 0.46 |
| පූර්ව ළමාවිය සංවර්ධනය | 51 | 0.30 | 92 | 0.37 | 509 | 0.80 |
| **ආර්ථික යටිතල පහසුකම්** | **8,991** | **53.20** | **13,238** | **52.95** | **35,323** | **55.20** |
| පළාත් මාර්ග | 2,951 | 17.46 | 4,300 | 17.20 | 10,324 | 16.13 |
| වතු යටිතල පහසුකම් | 159 | 0.94 | 236 | 0.94 | 490 | 0.77 |
| ප්‍රවාහන | 182 | 1.08 | 264 | 1.06 | 615 | 0.96 |
| ඉඩම් | 55 | 0.33 | 80 | 0.32 | 315 | 0.49 |
| කෘෂිකර්මය | 998 | 5.91 | 1,479 | 5.92 | 4,438 | 6.93 |
| පශුසම්පත් | 679 | 4.02 | 1,004 | 4.02 | 3,069 | 4.80 |
| මිරිදිය ධීවර | 209 | 1.24 | 309 | 1.24 | 773 | 1.21 |
| වාරිමාර්ග | 1,146 | 6.78 | 1,697 | 6.79 | 4,280 | 6.69 |
| ග්‍රාමීය සංවර්ධන | 318 | 1.88 | 463 | 1.85 | 1,200 | 1.88 |
| කුඩා කර්මාන්ත | 290 | 1.72 | 424 | 1.70 | 1,433 | 2.24 |
| ග්‍රාමීය විදුලිය | 88 | 0.52 | 135 | 0.54 | 614 | 0.96 |
| සංචාරක | 283 | 1.67 | 418 | 1.67 | 1,390 | 2.17 |
| පළාත් පාලන | 1,633 | 9.66 | 2,429 | 9.72 | 6,382 | 9.97 |
| **එකතුව** | **15,545** | **91.98** | **22,967** | **91.87** | **60,657** | **94.78** |
| නම්‍යශීලි අරමුදල | 988 | 5.85 | 700 | 2.80 | 1,977 | 3.09 |
| විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රදාන | 367 | 2.17 | 1,333 | 5.33 | 1,366 | 2.13 |
| **මුළු එකතුව** | **16,900** | **100.00** | **25,000** | **100.00** | **64,000** | **100.00** |

* 2025 අයවැය ඇස්තමේන්තුවට අනුව වෙන් කළ ප්‍රතිපාදන මෙහි දක්වා ඇත. ඇතැම් අංශවලට අදාළව මුලදී වෙන් කර දෙන ලද ප්‍රතිපාදන ප්‍රමාණයන් පළාත් බලධාරීන් විසින් කරන ලද ඉල්ලීම් අනුව පසුව සංශෝධනය කරන ලදි.

### 2.2.3 උපමාන පාදක ප්‍රදාන (CBG)

උපමාන පාදක ප්‍රදානය නිර්දේශ කරනු ලබන්නේ ද ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වන අතර, මෙම වාර්තාවේ 3.1 යටතේ සඳහන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා පුළුල්ව හඳුනාගනු ලැබූ විෂයන් 23ට අමතරව එකී විෂයන් 2 කට හෝ වැඩි ගණනකට අදාළ වන ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් සඳහා මෙම ප්‍රදානය වෙන් කෙරේ. එමෙන්ම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා සකස් කරනු ලබන වාර්ෂික සංවර්ධන සැලැස්ම අනුමත කිරීමෙන් පසු ව හඳුනා ගනු ලබන වෙනත් ප්‍රමුඛ අවශ්‍යතා, විශේෂයෙන්ම මහජන නියෝජිතයින් විසින් විටින් විට හඳුනාගනු ලබන අවශ්‍යතා සඳහා ද මෙම ප්‍රදාන යොදා ගැනේ.

මෙම උපමාන පාදක ප්‍රදානය අංශවලට වෙන් නොකර තනි අරමුදලක් ලෙස පළාත් සභා වෙත ලැබෙන අතර, ප්‍රාදේශීය විෂමතා අවම කිරීමේ අරමුණින් ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට දායක වන පරිදි මෙම ප්‍රදානය පළාත් සභාවේ අභිමතය පරිදි වැය කළ හැකිය. එම අරමුදල් භාවිතා කිරීමේ දී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා වෙත නිකුත් කරනු ලැබේ.

2021-2025 කාලසීමාව තුළ පළාත් සභාවලට වාර්ෂික අයවැය මගින් වෙන් කරන ලද උපමාන පාදක ප්‍රදානයන් හා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද අක්මුදල් පිළිබඳ තොරතුරු පහත අංක 03 වගුවෙහි දක්වා ඇත.

**වගුව 03: උපමාන පාදක ප්‍රදාන සඳහා වාර්ෂික අයවැය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන හා භාණ්ඩාගාරයෙන් නිදහස් කරන ලද අක්මුදල් ප්‍රමාණය (2021-2025)**

**(රු.මි.)**

| පළාත | 2021 | | | 2022 | | | 2023 | | | 2024 | | | 2025 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අයවැය මගින් වෙන් කිරීම | නිදහස් කරන ලද අක්මුදල | % | අයවැය මගින් වෙන් කිරීම | නිදහස් කරන ලද අක්මුදල | % | අයවැය මගින් වෙන් කිරීම | නිදහස් කරන ලද අක්මුදල | % | අයවැය මගින් වෙන් කිරීම | නිදහස් කරන ලද අක්මුදල | % | අයවැය මගින් වෙන් කිරීම |
| බස්නාහිර | 392.00 | 215.60 | 55 | 80.00 | 44.80 | 56 | 223 | 111.50 | 50 | 371 | 259.70 | 70 | 585 |
| මධ්‍යම | 560.00 | 308.00 | 55 | 190.00 | 106.40 | 56 | 333 | 166.50 | 50 | 555 | 388.50 | 70 | 730 |
| දකුණු | 494.41 | 271.93 | 55 | 125.00 | 70.00 | 56 | 304 | 152.00 | 50 | 506 | 379.50 | 75 | 692 |
| උතුරු | 580.82 | 319.45 | 55 | 115.00 | 64.40 | 56 | 386 | 193.00 | 50 | 644 | 450.80 | 70 | 727 |
| වයඹ | 508.00 | 279.40 | 55 | 201.00 | 112.56 | 56 | 301 | 150.50 | 50 | 502 | 376.50 | 75 | 678 |
| උතුරු මැද | 450.00 | 247.50 | 55 | 190.00 | 106.40 | 56 | 343 | 171.50 | 50 | 573 | 403.80 | 70 | 696 |
| ඌව | 560.48 | 308.26 | 55 | 165.00 | 92.40 | 56 | 369 | 184.50 | 50 | 616 | 462.00 | 75 | 763 |
| සබරගමුව | 595.00 | 327.25 | 55 | 85.00 | 47.60 | 56 | 360 | 180.00 | 50 | 599 | 419.30 | 70 | 753 |
| නැගෙනහිර | 511.31 | 281.22 | 55 | 180.00 | 100.80 | 56 | 381 | 190.50 | 50 | 634 | 475.50 | 75 | 726 |
| **එකතුව** | **4,652.02** | **2,558.61** | **55** | **1,331.00** | **745.36** | **56** | **3,000** | **1,500.00** | **50** | **5,000** | **3,615.60** | **72** | **6,350** |

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

# 3 වන පරිච්ඡේදය

## 2026 වර්ෂය සඳහා පළාත් ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් අවශ්‍යතා තක්සේරු කිරීම

### 3.1 2026 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (3) අනුව්‍යවස්ථාව අනුව මුදල් කොමිෂන් සභාව වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම පරිදි, 2025 පෙබරවාරි මස 11 වන දින මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා වෙත නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුගතව පළාත් බලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම්ව පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගනිමින්, මුදල් කොමිෂන් සභාව විසින් 2026 වර්ෂය සඳහා පළාත් සභාවන්හි ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවය හඳුනා ගෙන ඇත.

1. 2025.03.03 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ජාතික ප්‍රතිපත්ති රාමුව සහ අනෙකුත් ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මුදල් කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යභාරය
3. අයවැය සකස් කිරීම පිළිබඳ භාණ්ඩාගාර චක්‍රලේඛ
4. ඉදිරි වසර (2026) සඳහා රජයේ ප්‍රදාන අපේක්ෂාවෙන් පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා
5. පළාත් බලධාරීන් සමග කටයුතු කිරීමේ දී හඳුනාගත් අත්‍යාවශ්‍යයෙන්ම කළ යුතු සංවර්ධන අවශ්‍යතා මෙන්ම පළාත්වල මධ්‍ය කාලීන සංවර්ධන සැලසුම් තුළින් හඳුනාගත් ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා
6. සාධාරණ පරිදි ප්‍රතිලාභ බෙදී යන තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වන අවශ්‍යතාවයන්
7. පළාත්වල සමාජ - ආර්ථික තත්ත්වය
8. තිරසාර සංවර්ධන අභිමතාර්ථ සහ ඉලක්ක

මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශවලට අනුකූල වෙමින් ජාතික අයවැයෙන් අරමුදල් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් පළාත් සභා විසින් ඔවුන්ගේ වාර්ෂික ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා සකස් කර මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබිණ. රජයේ සංවර්ධන උපායමාර්ග සහ පළාතට සුවිශේෂී වූ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් හා තිරසර සංවර්ධන අභිමතාර්ථයන්ට අනුගත වෙමින් පළාත් සභා විසින් සකස් කර ඇති විස්තරාත්මක මධ්‍ය කාලීන ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම, ප්‍රාග්ධන අරමුදල් අවශ්‍යතා සකස් කිරීමේදී මූලිකව පදනම් කරගෙන ඇත.

ඒ අනුව, පහත දැක්වෙන අංශ (පළාත් සභා වෙත පවරා දෙනු ලැබූ විෂයයන්) සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) ස්වරූපයෙන් ජාතික අයවැයෙන් ලැබෙන අරමුදල් භාවිතා කර පළාත් සභාවල සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ඉදිරි වර්ෂය (2026) සඳහා අවශ්‍ය වන ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවය මුදල් කොමිෂන් සභාව විසින් තක්සේරු කර ඇත.

- ❖ අධ්‍යාපන
- ❖ බටහිර වෛද්‍ය
- ❖ දේශීය වෛද්‍ය
- ❖ පළාත් මාර්ග
- ❖ වාරිමාර්ග
- ❖ කෘෂිකර්ම
- ❖ සත්ත්ව නිෂ්පාදන
- ❖ මිරිදිය ධීවර
- ❖ කුඩා කර්මාන්ත
- ❖ ක්‍රීඩා
- ❖ පරිවාස හා ළමාරක්ෂක
- ❖ සමාජ සේවා
- ❖ සංස්කෘතික කටයුතු
- ❖ සමුපකාර සංවර්ධන
- ❖ මුල් ළමාවිය සංවර්ධන
- ❖ වතු යටිතල පහසුකම්
- ❖ ප්‍රවාහන
- ❖ නිවාස
- ❖ ග්‍රාමීය විදුලිය (පළාත් සභා ලැයිස්තුවේ අංක 34 අයිතමයෙහි විෂය සීමාව තුළ)
- ❖ පළාත් පාලන
- ❖ සංචාරක
- ❖ ග්‍රාමීය සංවර්ධන
- ❖ ඉඩම් සංවර්ධන

ඉහත අංශවල වාර්ෂික ක්‍රියාත්මක සැලසුම්වලින් ආවරණය නොවන සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සහ විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා වන නම්‍යශීලී අරමුදලක් ද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පළාත් වෙත වෙන් කර දී ඇත.

### 3.2 2026 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා තක්සේරු කිරීම

ඉහත 3.1 ඡේදයෙහි සඳහන් කරුණුවලට සහ ගරු පළාත් ආණ්ඩුකාරවරුන් ඇතුළු දේශපාලන බලධාරීන්ගේ උපදෙස් මෙන්ම විවිධ මහජන සංවිධාන වෙතින් පළාත් බලධාරීන් විසින් රැස් කර ගන්නා ලද තොරතුරු වලට අවධානය යොමු කරමින් පළාත් මධ්‍ය කාලීන සංවර්ධන සැලසුම් මත පදනම්ව අදාළ පළාත් බලධාරීන් සමග එක්ව පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් පළාත් ආංශික ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා මූලික වශයෙන් හඳුනාගෙන ඇත.

පළාත්වල පවතින විභවතාවයන් පළාතේ සංවර්ධනයට උපයෝගී කර ගැනීම සහ ආර්ථික යටිතල පහසුකම් සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රජයේ අරමුදල් ආයෝජන කළ යුතුය. පළාත් මට්ටමින් පෞද්ගලික අංශය සඳහා අවශ්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම ප්‍රමුඛ අවශ්‍යතාවයන් වේ. ඒ අනුව, අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් ඉදිකිරීම සහ පවතින භෞතික යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම, ප්‍රාදේශීය වශයෙන් ඇති අවිච්ඡේද වැඩ නිම කිරීම සහ ආයතනවල සහ ප්‍රතිලාභීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම ප්‍රාග්ධන අවශ්‍යතාවලට මූලිකව ඇතුළත් වේ.

ඉහත කරුණු මත පදනම්ව, 2026 වර්ෂයට පළාත් සභා නවය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ලෙස (PSDG) තක්සේරු කළ මුළු මුදල රු. මිලියන 132,000 කි. මීට අමතරව, 2026 වර්ෂය සඳහා රු. මිලියන 15,000 ක උපමාන පාදක ප්‍රදානයක් (CBG) ද පළාත් සභා වෙත ලබා දීමට මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත. ඒ අනුව,

| | | |
|---|---|---|
| නිර්දේශිත පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානය | රු.මිලියන | 132,000 |
| නිර්දේශිත උපමාන පාදක ප්‍රදානය | රු.මිලියන | 15,000 |
| **නිර්දේශිත මුළු ප්‍රාග්ධන අවශ්‍යතාවය** | රු.මිලියන | **147,000** |

2024 වර්ෂය දක්වා, පළාත් ආදායම් ඉලක්කය පළාත්වල සමස්ත පුනරාවර්තන අවශ්‍යතා සමග ගළපා ඇත. කෙසේ වෙතත්, 2025 වර්ෂයේ සිට පළාත් සභා නවය විසින් එකතු කරනු ලබන මුළු පළාත් ආදායමෙන් 50%ක් පමණක් පුනරාවර්තන වියදම් සමගත්, ඉතිරි 50% ප්‍රාග්ධන වියදම් (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන) සමගත් ගැළපීමට මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කරන ලදී. ඒ අනුව, මෙම යෝජනාව ඉදිරි වර්ෂ සඳහාත් මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබන අතර, මෙම වාර්තාවේ ඇමුණුම අංක 01 හි දැක්වෙන පරිදි 2026 වර්ෂය සඳහා වන සමස්ත පළාත් ආදායම් ඉලක්කයෙන් 50%ක් ප්‍රාග්ධන වියදම් සමග ගැළපීමට මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කෙරේ. ඒ අනුව, ආදායම් ඉලක්ක ගැළපීමෙන් පසු නිර්දේශිත මුළු පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රමාණය රු. මිලියන 114,647.50කි. මෙම මුදල 2026 වර්ෂය සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ නියම කරන ලද ප්‍රාග්ධන වියදම් සීමාවන් සමග ගලපා ගැනීම පිළිබඳව මෙම වාර්තාවේ 4.1.2 යටතේ දැක්වේ.

### 3.3 2026 වර්ෂය සඳහා සාමූහික ප්‍රදාන අවශ්‍යතාවය තක්සේරු කිරීම

මුදල් කොමිෂන් සභාව විසින් 2025 මාර්තු 7 වැනි දින නිකුත් කරන ලද පුනරාවර්තන අයවැය සකස් කිරීම සඳහා වූ මාර්ගෝපදේශයන්ට අනුව, පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද පුනරාවර්තන අවශ්‍යතා පරීක්ෂා කර පළාත් බලධාරීන් හා මුදල් අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් අයවැය සාකච්ඡා පැවැත්වීමෙන් පසු මුදල් කොමිෂන් සභාව විසින් 2026 වර්ෂය සඳහා පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කරන ලදී.

2026 වර්ෂයේ පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම පහත සඳහන් කරුණු මත පදනම් වේ.

### I. පුද්ගල පඩිනඩි

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2025.03.31 දිනට අනුමත කරන ලද සේවක සංඛ්‍යාව සහ අයවැය සාකච්ඡාවලදී එකඟ වූ පහත සඳහන් කරුණු මත පදනම්ව වැටුප් හා වේතන අවශ්‍යතාවය තක්සේරු කර ඇත.

(i) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල 2025.03.31 දිනට අනුමත කරන ලද සේවක සංඛ්‍යාව 459,015 වේ.

**වගුව 04: කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල 2025.03.31 දිනට අනුමත කරන ලද සේවක සංඛ්‍යාව**

| විස්තරය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2025.03.31 දිනට අනුමත කරන ලද මුළු පළාත් සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව (සාමාජිකයින් සහ අනෙකුත් අය හැර) | පුරප්පාඩු වූ සේවක සංඛ්‍යාව | අයවැයගත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| පළාත් සභා | 399,526 | 353,562 | 63,123 | 416,685 |
| පළාත් පාලන | 59,489 | 44,794 | 12,607 | 57,401 |
| **මුළු සේවක සංඛ්‍යාව** | **459,015** | **398,356** | **75,730** | **474,086** |

ඇතැම් අවස්ථාවලදී, පළාත් විසින් ඉදිරිපත් කරන ලද සේවක සංඛ්‍යාව මෙන්ම ඇතැම් පළාත් පාලන ආයතනවල සිටින සේවක සංඛ්‍යාවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවක සංඛ්‍යාවට වඩා වැඩි බව දක්නට ලැබේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරුවල සිටින සේවක සංඛ්‍යාව හා එම දෙපාර්තමේන්තුව විසින්

අනුමත කිරීමට අපේක්ෂිත තනතුරුවල සිටින සේවක සංඛ්‍යාවට පමණක් අදාළ පුද්ගල පඩිනඩි සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිර්දේශ කර ඇත.

(ii) 2026 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශ මගින් පළාත් සභාවලට බඳවා ගැනීමට සහ අනුයුක්ත කිරීමට අපේක්ෂිත මාණ්ඩලික ශ්‍රේණියේ සහ තාක්ෂණික තනතුරු 34,467 සඳහා පහත සඳහන් මුදල් ප්‍රමාණයන් ඇස්තමේන්තු කර ඇත.

| | |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | රු.මි. 30,188 |
| සෞඛ්‍ය හා ජනමාධ්‍යය අමාත්‍යාංශය | රු.මි. 5,827 |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | රු.මි. 297 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | රු.මි. 39 |
| **රේඛීය අමාත්‍යාංශ බඳවා ගැනීම් සඳහා මුළු පුද්ගල පඩිනඩි** | **රු.මි. 36,351** |

(iii) රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත සේවයේ ස්ථිර කරන ලද උපාධිධාරීන් සඳහා ද (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මේ තනතුරු තවමත් අනුමත කර නොමැති වුවද) 2026 වර්ෂයට මුදල් ඇස්තමේන්තු කර ඇත.

(iv) අනුමත තනතුරු නොමැතිව රජයේ තීරණ මත ස්ථිර කරන ලද සේවකයින් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 25/2014 සහ 29/2019 ප්‍රකාරව තවමත් ස්ථිර කර නොමැති කාර්ය මණ්ඩලය සඳහා පඩිනඩි ඇස්තමේන්තු කර ඇත.

(v) 2026 වසර සඳහා පළාත් පාලන ආයතනවල අනුමත සේවක සංඛ්‍යාවේ වැටුප් සහ පළාත් පාලන ආයතන සභිකයන්ගේ දීමනා ගෙවීම සඳහා තක්සේරු කරන ලද ඇස්තමේන්තුව රු.මි 34,930 ක් වේ. 2024 වසරේ අයවැය යෝජනා පරිදි, 2026 වසර සඳහා පළාත් පාලන ආයතන සඳහා වැටුප් ගණනය කිරීමේදී මහ නගර සභා සඳහා 40% ක සහ නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා 20% ක ප්‍රමාණයකින් අඩු කෙරෙතියි යන උපකල්පනය මත මේ සඳහා වූ ඇස්තමේන්තුව සකස් කර ඇත.

මෙම ගණනය කිරීමේ දී 2024.06.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පළාත් පාලන ආයතනය විසින් ස්ථිර කරන ලද අනියම් සේවකයින් 8,435 ද සැලකිල්ලට ගෙන ඇති අතර, ඉන් 6,678 දෙනෙකු සඳහා අදාළ පළාත් පාලන ආයතනවලින් ගෙවීම් සිදු කරනු ලබන බව තහවුරු කොට ඇත. ඒ අනුව, මධ්‍යම රජයෙන් වැටුප් ප්‍රතිපූරණයට අදාළ සේවකයන් සඳහා වූ වැටුප් හා වේතන මෙහි ඇතුළත් ව ඇත.

(vi) මුදල් කොමිෂන් සභාව විසින් ගන්නා ලද 2018.04.25 තීරණයට අනුව, පළාත් ව්‍යවස්ථාපිත ආයතන තුනකට පැවරී ඇති කාර්යයන්හි වැදගත්කම සලකා බලා ඒවායේ අනුමත කාර්යමණ්ඩලවලට පමණක් මහා භාණ්ඩාගාරය විසින් වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන නිර්දේශ කරන අතර, එයට පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය (PRDA), පළාත් මගී ප්‍රවාහන අධිකාරිය (PPTA) සහ මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය (ECDA) ඇතුළත් වේ. අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතනයන්හි කාර්යමණ්ඩල පිරිවැය එකී ආයතනවල ඉපැයීම්වලින් පිරිමසා ගත යුතුව ඇත.

(vii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 මගින් යෝජනා කරන ලද වැටුප් සංශෝධනය මත පදනම්ව වැටුප් හා වේතන තක්සේරු කරන ලද අතර, අතිකාල සහ නිවාඩු වැටුප් සඳහා අවශ්‍යතාවය, ගණනයේ දී ඒක පුද්ගල පිරිවැය ද සැලකිල්ලට ගෙන ඇත.

(viii) පළාත්වලින් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ඉදිරිපත් කරන ලද හිඟ වැටුප්, කරුණු තහවුරු කර ගැනීමෙන් අනතුරුව මේ සඳහා ඇතුළත් කොට ඇත.

(ix) පළාත් සභා සඳහා තේරී පත්වන සභිකයින් සඳහා වන සභික දීමනා සහ ඔවුන්ගේ පුද්ගලික කාර්යමණ්ඩලයේ පුද්ගල පඩිනඩි සඳහා වන වියදම් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ අනුව ඇස්තමේන්තු කර ඇත.

## II. අනෙකුත් පුනරාවර්තන වියදම්

(i) පාසල් පෝෂණ වැඩසටහන

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ED/16/02/02/03/2025 හා 2025.06.20 දිනැති ලිපියෙන් කරන ලද ඉල්ලීමට අනුව, පළාත් සහ ජාතික පාසල් දෙවර්ගයටම පාසල් පෝෂණ වැඩසටහන සඳහා (මුළු පාසල් සංඛ්‍යාව 9,099 ක සිටින ළමුන් 1,523,436කට පාසල් දින 200 හා ආහාර වේලක් සඳහා දෛනික පිරිවැය රු. 110 ලෙස සැලකිල්ලට ගනිමින්) ඇස්තමේන්තුගත රු. මිලියන 33,516 ක මුදලක් ඇතුළත් කර ඇත. (පළාත් සභා විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම ව්‍යාපෘතියේ පරිපාලන වියදම් මේ යටතේ ඇතුළත් කර නොමැත. කලින් එළඹුණු එකඟතාවයකට අනුව, එකී වියදම් (රේඛීය) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සලසනු ඇතැයි අපේක්ෂා කෙරේ).

(ii) නඩත්තු වියදම්

එදිනෙදා අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් අරමුදල් සහතික කිරීම පිණිස සාමාන්‍ය නඩත්තු වියදම් අවශ්‍යතාවය සහ මාර්ග, වාරිමාර්ග, අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂිකර්ම සහ අනෙකුත් අංශවල ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු ඇතුළු පළාත් වත්කම් අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන වත්කම් නඩත්තු අවශ්‍යතාවය වෙන වෙනම තක්සේරු කර රු. මිලියන 27,517 ක මුදලක් ඇතුළත් කොට ඇත.

(iii) අනෙකුත් සමාජ සුභසාධන වියදම්

විශේෂ අවශ්‍යතා සහිත ළමුන්, වැඩිහිටි නිවාසයන් මෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කලින් කලට යෝජනා කරන ලද පරිදි පිළිකා, වකුගඩු, ක්ෂය රෝගීන් සඳහා වෙන් කළ යුතුව ඇති සමාජ සුබසාධන වියදම් ද අනෙකුත් පුනරාවර්තන වියදම් යටතේ දක්වා ඇත.

(iv) අවිනිශ්චිත අවස්ථා අරමුදල සඳහා පළාත් සභා විසින් ඉල්ලා සිටින ලද රු. මිලියන 2,602 ක මුදල ද අපගේ ඇස්තමේන්තුව තුළට ඇතුළත් කර ඇත.

(v) මධ්‍යම රජය සහ පළාත් සේවකයන් අතර පවතින විෂමතාවය නැති කිරීම සඳහා අත්තිකාරම් B ගිණුම වෙනුවෙන් 2026 වර්ෂය සඳහා රු. මිලියන 8,810ක ප්‍රතිපාදන ඇතුළත් කර ඇත.

වගුව 05: පළාත් අනුව 2026 වසර සඳහා තක්සේරු කළ පුනරාවර්තන අවශ්‍යතා

(රු.මි.)

| පළාත | 2025.03.31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කළ පළාත් සේවක සංඛ්‍යාව | පුද්ගල පඩිනඩි | පුද්ගල පඩිනඩිවල පළාත් කොටස (%) | අනෙකුත් පුනරාවර්තන වියදම් | අනෙකුත් පුනරාවර්තන වියදම්හි පළාත් කොටස (%) | මුළු පුනරාවර්තන වියදම් | මුළු පුනරාවර්තන වියදම්හි පළාත් කොටස (%) |
|---|---|---|---|---|---|---|---|
| **(1)** | **(2)** | **(3)** | **(4)** | **(5)** | **(6)** | **(7) = (3) + (5)** | **(8)** |
| බස්නාහිර | 87,837 | 104,848.85 | 18.08 | 19,061.25 | 18.83 | 123,910.10 | 18.20 |
| මධ්‍යම | 61,565 | 76,963.22 | 13.27 | 11,835.20 | 11.69 | 88,798.42 | 13.04 |
| දකුණු | 54,384 | 69,227.05 | 11.94 | 11,757.15 | 11.61 | 80,984.20 | 11.89 |
| උතුරු | 41,351 | 49,925.23 | 8.61 | 8,940.58 | 8.83 | 58,865.81 | 8.64 |
| වයඹ | 55,211 | 70,688.15 | 12.19 | 11,191.60 | 11.06 | 81,879.75 | 12.02 |
| උතුරු මැද | 32,938 | 42,364.52 | 7.31 | 9,333.88 | 9.22 | 51,698.40 | 7.59 |
| ඌව | 38,573 | 46,934.38 | 8.10 | 8,009.72 | 7.91 | 54,944.10 | 8.07 |
| සබරගමුව | 43,010 | 58,833.11 | 10.15 | 10,595.54 | 10.47 | 69,428.65 | 10.20 |
| නැගෙනහිර | 44,146 | 59,992.98 | 10.35 | 10,502.01 | 10.37 | 70,494.99 | 10.35 |
| **මුළු එකතුව** | **459,015** | **579,777.48** | **100.00** | **101,226.94** | **100.00** | **681,004.42** | **100.00** |

| | | |
|---|---|---|
| එකතු කිරීම් - | අවිනිශ්චිත අරමුදල - 2026 | 2,602.00 |
| | අත්තිකාරම් B ගිණුම සඳහා ඉල්ලීම - 2026 | 8,810.00 |
| **තක්සේරු කළ සම්පූර්ණ පුනරාවර්තන අවශ්‍යතා** | | **692,416.42** |

සටහන:-

3 තීරුව - සත්‍ය සේවක සංඛ්‍යාව සහ පුරප්පාඩු සඳහා පුද්ගල පඩිනඩි, රේඛීය අමාත්‍යාංශ අනුයුක්ත කිරීම් සහ හිඟ වැටුප් ඇතුළත් වේ.

5 තීරුව - පාසල් පෝෂණ වැඩසටහන සඳහා වියදම්, නඩත්තු වියදම්, සැපයුම්, ගිවිසුම්ගත සේවා (පළාත් පාලන ආයතනවලට අයත් මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් ඇතුළත් නොවේ.)

ඒ අනුව, 2026 වර්ෂය සඳහා පළාත් පුනරාවර්තන වියදම් අවශ්‍යතාවය රු.මි. 692,416 කි.

### 3.4 2026 වර්ෂය සඳහා කොමිෂන් සභාවේ නිර්දේශ හා රජය විසින් තීරණය කරන ලද අනුගම්‍ය වියදම් සීමාවන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154ජ (3) අනුව්‍යවස්ථාවෙන් අපේක්ෂිත පරිදි, මුදල් කොමිෂන් සභාව විසින් ඉහත අයුරින් ක්‍රමවත් ලෙස පළාත් අවශ්‍යතා ගණනය කර පළාත් සභා නවය සඳහා අත්‍යවශ්‍ය ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් පිළිබඳව නිර්දේශ 2025.08.14 දින මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලදි. එසේ වුවද, 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ප්‍රකාරව පළාත් නවය වෙත වෙන් කර දීම සඳහා පුරෝකථනය කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයන් වන්නේ සමස්ත ප්‍රාග්ධන ප්‍රතිපාදනය රු. මිලියන 77,000ක් හා සමස්ත පුනරාවර්තන ප්‍රතිපාදනය රු. මිලියන 533,000කි. 2026 වර්ෂය සඳහා ඉදිරිපත් කර

ඇති අයවැය පනත් කෙටුම්පතෙහි ද ඇතුළත් කර තිබෙනුයේ ඒ හා සමාන ප්‍රතිපාදනයකි. ඒ අනුව, ලබා දී ඇති ප්‍රාග්ධන ප්‍රතිපාදනය පළාත් අතර බෙදා දීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශිත ප්‍රතිශතයන් අනුවම ඉහත කී ප්‍රතිපාදන පළාත් අතර වෙන් කර ඒ පිළිබඳව පළාත් ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර ඇත. එසේ වුවද, වෙන් කර දෙනු ලැබ ඇති පුනරාවර්තන වියදම නිර්දේශිත පුනරාවර්තන වියදම්වලට වඩා අඩුවීම හේතුවෙන් මෙම වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ 4.3 යටතේ දක්වා ඇති ගැටළුවලට මුහුණ දීමට ඉදිරියේදී සිදු වනු ඇත.

### 3.5 පළාත් ආදායම්

පළාත් සභා සඳහා ආදායම ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෙයාකාරයකින් ලැබේ.

#### I. රජයේ මාරුකිරීම් හරහා ලැබෙන ආදායම

පළාත් සභාවලට පවරා තිබූ ප්‍රධාන ආදායම් මූලාශ්‍රයක් වන ව්‍යාපාර පිරිවැටුම් බද්ද (BTT) අහෝසි කිරීමෙන් පසු, ඒ වෙනුවට මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2010 අනුව, මධ්‍යම රජයෙන් එකතු කරන ලද ආදායම් පළාත් සභා වෙත මාරු කිරීම සඳහා විශේෂිත වූ ක්‍රමයක් හඳුන්වා දුන් අතර, එය පහත දැක්වෙන ප්‍රතිශත මත පදනම්ව පළාත් සභා වෙත බෙදා දීමට කටයුතු කෙරේ.

a) ජාතිය ගොඩනැගීමේ බද්දෙන් (NBT) 33 1/3%

b) මුද්දර බද්දෙන් 100%

c) වාහන ලියාපදිංචි ගාස්තු වලින් 70%

රජයේ ආදායම් මාරු කිරීම හරහා පළාත් සභාවලට ලබාදෙන ප්‍රමාණය උක්ත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය අනුව තීරණය කෙරේ. මෙම ආදායම් මාරු කිරීම් ක්‍රමය හඳුන්වා දීමෙන් පසු, පළාත් සභා වෙත ආදායම් ලැබීම ඉහළ ගිය නමුත්, 2019 වසරේ දී ජාතිය ගොඩනැගීමේ බද්ද අහෝසි කිරීමෙන් පසු, පළාත් සභා ආදායම සැලකිය යුතු මට්ටමකින් පහත වැටුණි.

#### II. පළාත් සභාවලට පවරා ඇති මූලාශ්‍රවලින් එකතු කරන ආදායම

පළාත් සභා වලට පවරා ඇති ආදායම් මූලාශ්‍ර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ නවවැනි උපලේඛනයේ 36.01 සිට 36.20 දක්වා සඳහන් බදු සහ බදු නොවන ආදායම්වලින් සමන්විත වේ. පළාත් සභා ආදායම්වල ප්‍රධාන මූලාශ්‍ර ලෙස මුද්දර ගාස්තු, මෝටර් රථ බලපත්‍ර ගාස්තු, මත්පැන් අලෙවි සැල් සඳහා වූ බලපත්‍ර ගාස්තු, උසාවි දඩ සහ වෙනත් ආදායම් ඇතුළත් වේ. මෙම මූලාශ්‍ර අතරින් මුද්දර ගාස්තු සහ උසාවි දඩ පළාත් සභා විසින් නිත්‍යානුකූලව පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතුව ඇත.

පළාත් සභාවලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවරා ඇති ආදායම් මූලාශ්‍ර (මුද්දර ගාස්තු, උසාවි දඩ, මෝටර් රථ බලපත්‍ර ගාස්තු, මත්පැන් සඳහා බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් ආදායම් මූලාශ්‍රයන්) සඳහා මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරි වර්ෂය වෙනුවෙන් ආදායම් ඉලක්කයන් ලබාදෙනු ලැබේ. සාමාන්‍යයෙන් මහා භාණ්ඩාගාරය විසින් පළාත් සභා සඳහා සාමූහික ප්‍රදානය **(Block Grant)** තීරණය කිරීමේදී, පළාත්වලින් අපේක්ෂිත මුළු ආදායම් ප්‍රමාණය, සමස්ත පුනරාවර්තන වියදම් අවශ්‍යතාවයෙන් අඩු කරනු ලැබේ. මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරි වර්ෂය සඳහා පළාත් ආදායම් ඉලක්ක තීරණය කිරීමේදී, එම අදාළ පළාත් විසින් පුරෝකථනය කරන ලද වාර්ෂික ආදායම් එකතු කිරීමට අදාළ තක්සේරුව, පෙර වසරවල ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය සමග ද අධ්‍යනය කර තීරණය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද පළාත් ආදායම් ප්‍රමාණය මුද්දර ගාස්තු සහ උසාවි දඩ ඇතුළුව රු.මි. 81,610 කි. ඉන් මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් හැර පළාත් සභා වෙත 2026 වර්ෂය සඳහා භාවිතා කළ හැකි ප්‍රමාණය රු.මි.34,705 කි. එයට හේතු වන්නේ, මුද්දර බද්ද සහ උසාවි දඩ පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු බැවිනි. පළාත් සභා වලට පවරා දී ඇති මූලාශ්‍ර යටතේ 2026 වර්ෂයට සකස් කරන ලද ආදායම් පුරෝකථනය වගු අංක 06 තුළ දක්වා ඇත.

**වගුව 06: 2026 වසර සඳහා පළාත් සභා වෙත ලබාදුන් ආදායම් ඉලක්කය**

රු.මි

| පළාත | මත්පැන් අලෙවිසැල් සඳහා බලපත්‍ර ගාස්තු | මෝටර් රථ බලපත්‍ර ගාස්තු | මුද්දර ගාස්තු | උසාවි දඩ | *වෙනත් | එකතුව (මුද්දර ගාස්තු සහ උසාවි දඩ හැර) | එකතුව (මුද්දර ගාස්තු සහ උසාවි දඩ ඇතුළුව) |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 800 | 5,600 | 24,000 | 2,100 | 7,500 | 13,900 | 40,000 |
| මධ්‍යම | 400 | 1,450 | 2,500 | 170 | 900 | 2,750 | 5,420 |
| දකුණු | 155 | 1,850 | 5,400 | 925 | 1,420 | 3,425 | 9,750 |
| උතුරු | 40 | 700 | 2,100 | 500 | 960 | 1,700 | 4,300 |
| වයඹ | 180 | 2,100 | 3,400 | 490 | 2,300 | 4,580 | 8,470 |
| උතුරු මැද | 70 | 920 | 320 | 750 | 1,761 | 2,751 | 3,821 |
| ඌව | 120 | 700 | 700 | 300 | 700 | 1,520 | 2,520 |
| සබරගමුව | 125 | 1,250 | 1,500 | 400 | 1,400 | 2,775 | 4,675 |
| නැගෙනහිර | 94 | 805 | 900 | 450 | 405 | 1,304 | 2,654 |
| **මුළු එකතුව** | **1,984** | **15,375** | **40,820** | **6,085** | **17,346** | **34,705** | **81,610** |

***වෙනත් - බදු, පොලී, විභාග ගාස්තු, ප්‍රාග්ධන වත්කම් විකිණීම සහ ඔට්ටු බදු ආදිය ඇතුළත් වේ.**

2026 වසර සඳහා පුරෝකථනය කරන ලද මුළු ආදායමෙන් රු. මි. 46,905 ක් මුද්දර ගාස්තු සහ උසාවි දඩ ලෙස තක්සේරු කර ඇති අතර, එක් එක් පළාත් සභාව විසින් පළාත් පාලන ආයතන වෙත මාරු කෙරෙන මුද්දර ගාස්තු සහ උසාවි දඩ පළාත් අනුව 07 වන වගුව තුළ දැක්වේ.

**වගුව 07: 2026 වසර සඳහා පළාත් පාලන ආයතන වෙත මාරු කිරීමට ඇස්තමේන්තු කරන ලද මුද්දර ගාස්තු සහ උසාවි දඩ ඉලක්ක.**

රු.මි

| පළාත | මුද්දර ගාස්තු | උසාවි දඩ | එකතුව | පළාත් කොටස (%) |
|---|---|---|---|---|
| බස්නාහිර | 24,000 | 2,100 | 26,100 | 55.64 |
| මධ්‍යම | 2,500 | 170 | 2,670 | 5.69 |
| දකුණු | 5,400 | 925 | 6,325 | 13.48 |
| උතුරු | 2,100 | 500 | 2,600 | 5.54 |
| වයඹ | 3,400 | 490 | 3,890 | 8.29 |
| උතුරු මැද | 320 | 750 | 1,070 | 2.28 |
| ඌව | 700 | 300 | 1,000 | 2.13 |
| සබරගමුව | 1,500 | 400 | 1,900 | 4.05 |
| නැගෙනහිර | 900 | 450 | 1,350 | 2.88 |
| **මුළු එකතුව** | **40,820** | **6,085** | **46,905** | **100.00** |

පසුගිය වසර 06 තුළ පළාත් ආදායම පළාතේ වියදමේ ප්‍රතිශතයක් ලෙස වගුව 08හි දක්වා ඇත.

**වගුව 08: පළාත් වියදම් සහ ආදායම් ලැබීම් (2019-2024)**

රු.මි

| වර්ෂය | මුළු වියදම | එකතු කළ ආදායම (මුද්දර ගාස්තු සහ උසාවි දඩ හැර ) | රජයේ ආදායම් මාරු කිරීම් | * පළාතේ මුළු ආදායම | ආදායම පළාතේ වියදමේ % ලෙස |
|---|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5=(3+4)** | **6=(5/2)** |
| **2019** | 303,740 | 18,928 | 47,070 | **65,998** | 22 |
| **2020** | 326,418 | 16,767 | 11,240 | 28,007 | 9 |
| **2021** | 342,023 | 18,012 | 10,500 | 28,512 | 8 |
| **2022** | 400,165 | 24,800 | 10,189 | 34,989 | 9 |
| **2023** | 431,014 | 34,752 | 11,737 | 46,489 | 11 |
| **2024** | 474,677 | 33,243 | 16,060 | 49,303 | 10 |

*** පළාත් පාලන ආයතන වලට මාරු කළ යුතු මුද්දර ගාස්තු සහ උසාවි දඩ හැර**

ජනාධිපති ලේකම්වරයාගේ 2020.02.19 දිනැති ලිපිය මගින් ලබා දී ඇති උපදෙස් අනුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන විසින් සිය බදු ව්‍යුහයන් සමාලෝචනය කරන තෙක් බදු සංශෝධනය නොකළ යුතුව ඇත. පළාත් බලධාරීන් විසින් ලබා දී ඇති තොරතුරුවලට අනුව බස්නාහිර පළාත හැර සෙසු පළාත් 08 හි ආදායම ප්‍රමාණවත් වනුයේ පළාතේ වියදමෙන් සියයට 6ක් පමණ ආවරණය කර ගැනීමටයි. ඒ අනුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආදායම් ධාරිතාවය පරිපූර්ණ වශයෙන් උපයෝගී කරගැනීම මූලික අවශ්‍යතාවක් ලෙස සැලකේ.

ඇතැම් ආදායම් ප්‍රභවයයන්ට අදාළ බදු අනුප්‍රමාණ තීරණය කර ඇත්තේ බොහෝ කලකට පෙර වන අතර එම අනුප්‍රමාණ කාලානුරූපව සංශෝධනය කළ යුතුව ඇත. බදු අනුප්‍රමාණ කාලානුරූපව සංශෝධනය නොවීමත්, පළාත් සභාවන්ට හිමි ඇතැම් ආදායම් රේඛීය අමාත්‍යාංශ විසින් පළාත් සභාවලට මාරු නොකිරීමත් පළාත් සභාවන්ට අහිතකර ලෙස බලපා ඇත.

පහත අංක 09 වගුව තුළින් පසුගිය වසර 06 තුළ ආදායම් ඉලක්ක සහ ආදායම් එකතු කිරීම අතර වූ සැසඳුම දැක්වෙයි.

**වගුව 09: පළාත් සභා ආදායම් විෂයන්ට අදාළ ආදායම් ඉලක්ක සහ ආදායම් එකතු කිරීම - (2019-2024)**

රු.මි

| පළාත | 2019 | | | 2020 | | | 2021 | | | 2022 | | | 2023 | | | 2024 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්ක | එකතු කිරීම | % | ඉලක්ක | එකතු කිරීම | % | ඉලක්ක | එකතු කිරීම | % | ඉලක්ක | එකතු කිරීම | % | ඉලක්ක | එකතු කිරීම | % | ඉලක්ක | එකතු කිරීම | % |
| බස්නාහිර | 26,385 | 21,987 | 83 | 26,750 | 19,521 | 73 | 25,400 | 28,285 | 111 | 23,175 | 35,295 | 152 | 27,806 | 37,607 | 135 | 30,700 | 38,808 | 126 |
| මධ්‍යම | 4,078 | 3,677 | 90 | 4,195 | 3,304 | 79 | 4,650 | 3,953 | 85 | 3,940 | 4,615 | 117 | 4,375 | 4,599 | 105 | 4,505 | 5,556 | 123 |
| දකුණු | 4,366 | 4,580 | 105 | 4,550 | 4,359 | 96 | 4,846 | 5,304 | 109 | 4,037 | 5,954 | 147 | 4,883 | 6,973 | 143 | 6,006 | 8,149 | 136 |
| උතුරු | 1,580 | 1,990 | 126 | 1,860 | 2,074 | 112 | 2,135 | 2,313 | 108 | 2,345 | 2,948 | 126 | 2,499 | 3,839 | 154 | 3,040 | 4,068 | 134 |
| වයඹ | 4,707 | 4,678 | 99 | 4,970 | 4,438 | 89 | 5,110 | 5,825 | 114 | 5,252 | 7,012 | 134 | 5,340 | 9,143 | 171 | 6,345 | 8,116 | 128 |
| උතුරු මැද | 1,541 | 1,691 | 110 | 1,826 | 1,904 | 104 | 1,951 | 1,888 | 97 | 1,812 | 2,180 | 120 | 1,955 | 2,914 | 149 | 2,225 | 3,402 | 153 |
| ඌව | 1,495 | 1,389 | 93 | 1,605 | 1,416 | 88 | 1,640 | 1,604 | 98 | 1,629 | 1,760 | 108 | 1,500 | 2,032 | 135 | 1,790 | 2,491 | 139 |
| සබරගමුව | 2,195 | 2,720 | 124 | 2,275 | 2,350 | 103 | 2,500 | 2,508 | 100 | 2,477 | 2,810 | 113 | 2,535 | 4,046 | 160 | 2,920 | 4,545 | 156 |
| නැගෙනහිර | 1,640 | 1,523 | 93 | 1,725 | 1,637 | 95 | 1,780 | 1,770 | 99 | 1,752 | 2,057 | 117 | 1,870 | 2,813 | 150 | 2,075 | 2,644 | 127 |
| **මුළු එකතුව** | **47,987** | **44,235** | **92** | **49,756** | **41,003** | **82** | **50,012** | **53,450** | **107** | **46,419** | **64,631** | **139** | **52,763** | **73,966** | **140** | **59,606** | **77,778** | **130** |

***මුද්දර ගාස්තු සහ උසාවි දඩ ඇතුළු ආදායම් එකතු කිරීම් සහ ඉලක්ක**

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කර ඇති රාජ්‍ය ආදායමෙන් පළාත් සභා වෙත මාරු කිරීමට අදාළ අගයන් පළාත් ආදායම් තක්සේරුව සඳහා සැලකිල්ලට ගෙන ඇත. එකී ආදායම් ඉලක්කයන් හා පළාත් සභාව වෙත මාරු කරන ලද ආදායම් පිළිබඳ තොරතුරු පහත අංක 10 වගුව මගින් දැක්වේ.

**වගුව 10 : භාණ්ඩාගාරයෙන් පළාත් සභා වෙත ආදායම් මාරු කිරීම - ඉලක්ක සහ නිදහස් කරන ලද ප්‍රමාණය (2021-2024)**

රු.මි

| පළාත | 2021 | | | 2022 | | | 2023 | | | 2024 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්ක | නිදහස් කිරීම | % | ඉලක්ක | නිදහස් කිරීම | % | ඉලක්ක | නිදහස් කිරීම | % | ඉලක්ක | නිදහස් කිරීම | % |
| බස්නාහිර | 6,720 | 5,001 | 74 | 6,720 | 4,734 | 70 | 6,000 | 5,680 | 95 | 7,608 | 7,669 | 101 |
| මධ්‍යම | 1,260 | 952 | 76 | 1,260 | 897 | 71 | 1,125 | 1,093 | 97 | 1,427 | 1,459 | 102 |
| දකුණු | 1,260 | 951 | 75 | 1,260 | 893 | 71 | 1,125 | 1,074 | 95 | 1,427 | 1,470 | 103 |
| උතුරු | 700 | 513 | 73 | 700 | 531 | 76 | 625 | 540 | 86 | 793 | 784 | 99 |
| වයඹ | 1,260 | 954 | 76 | 1,260 | 1,096 | 87 | 1,125 | 998 | 89 | 1,427 | 1,518 | 106 |
| උතුරු මැද | 700 | 538 | 77 | 700 | 500 | 71 | 625 | 600 | 96 | 793 | 702 | 89 |
| ඌව | 700 | 522 | 75 | 700 | 493 | 70 | 625 | 586 | 94 | 793 | 813 | 103 |
| සබරගමුව | 700 | 536 | 77 | 700 | 504 | 72 | 625 | 617 | 99 | 793 | 840 | 106 |
| නැගෙනහිර | 700 | 533 | 76 | 700 | 539 | 77 | 625 | 549 | 88 | 793 | 805 | 102 |
| **මුළු එකතුව** | **14,000** | **10,500** | **75** | **14,000** | **10,187** | **73** | **12,500** | **11,737** | **94** | **15,851** | **16,060** | **101** |

**මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ වාර්තා සහ පළාත් ආදායම් එකතු කිරීමේ වාර්තා**

ඒ අනුව, ඇතැම් වසරවලදී, පළාත් සභා සඳහා හිමිවන ආදායම් කොටස සම්පූර්ණයෙන් මාරු කර නොමැති බවත්, ඒ හේතුවෙන් 2024 වර්ෂයේදී අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩි ආදායම් ප්‍රමාණයක් සමස්තයක් ලෙස පළාත් සභා වෙත මාරු කර ඇති බවත් පෙනී යයි .

# 4 වන පරිච්ඡේදය

## 2026 වර්ෂය සඳහා පළාත් සහා අතර රජයේ ප්‍රදාන බෙදා වෙන් කර දීම පිළිබඳ නිර්දේශ

### 4.1 ප්‍රාග්ධන ප්‍රදාන පළාත් අතර වෙන් කර දීම පිළිබඳ නිර්දේශ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (3) අනු ව්‍යවස්ථාවේ, එක් එක් පළාතේ අවශ්‍යතා සපුරාලීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් අරමුදල් ආණ්ඩුව විසින් කොමිෂන් සභාවේ නිර්දේශ සහ කොමිෂන් සභාව විමසා වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන් කර දිය යුතු යැයි සඳහන් වේ. එකී ක්‍රියාවලිය පහසු කර ලීම සඳහා පළාත් සභාවලට වාර්ෂික අයවැයෙන් වෙන් කළ යුතු මුදල පිළිබඳව මුදල් කොමිෂන් සභාව විසින් රජයට නිර්දේශ ඉදිරිපත් කළ යුතු වේ.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (4) අනුව්‍යවස්ථාවට අනුව, පළාත් සඳහා රජය විසින් වාර්ෂිකව වෙන් කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදා වෙන් කළ යුතු ආකාරය පිළිබඳ ප්‍රතිපත්ති ඇතුළත් නිර්දේශ, ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීමේ වගකීමද මුදල් කොමිෂන් සභාවට පැවරී ඇත. රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් ඉහත සඳහන් කළ ප්‍රතිපත්ති පිළියෙල කිරීමේදී පහත සඳහන් නිර්ණායක සැලකිල්ලට ගත යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154ජ (5) අනුව්‍යවස්ථාවෙහි දක්වා ඇත.

- අ) එක් එක් පළාතේ ජන සංඛ්‍යාව
- ආ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම
- ඇ) විවිධ පළාත් අතර සමාජ හා ආර්ථික විෂමතා අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාව හා
- ඈ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම සහ පළාත් අතර වැඩිම ඒක පුද්ගල ආදායම අතර වෙනස අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාව

#### 4.1.1 පළාත් අතර ප්‍රාග්ධන අරමුදල් බෙදා හැරීම සඳහා භාවිතා කරන ක්‍රමවේදය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (5) අනුව්‍යවස්ථාවෙන් අදහස් කෙරෙන තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අත්කර ගැනීමට නම්, ඉහත කී නිර්ණායකයන් සහ එකී නිර්ණායකයන් වඩාත් අර්ථවත් වන අන්දමේ හා සංඛ්‍යාත්මකව දැක්විය හැකි අන්දමේ වෙනත් නිර්ණායකයන් ද යොදා ගනිමින් සම්පත් බෙදා දීම සඳහා දර්ශකයක් සකස් කර ගත යුතුව ඇත. ඒ අනුව, 2026 සඳහා වන දර්ශකය සකස් කිරීමේදී ඉහත (අ) සහ (ආ) නිර්ණායක මෙන්ම ඉහත (ඇ) සහ (ඈ) යන නිර්ණායකයන් සංඛ්‍යාත්මකව නිරූපණය කළ හැකි අන්දමට එක් එක් පළාතට ආදාළව මෙහි පහත දැක්වෙන (iii), (iv), (v) සහ (vi) යන නිර්ණායකයන් යොදා ගැනීමට මුදල් කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

- (i) ජන සංඛ්‍යාව[අ]
- (ii) මාසික මධ්‍යන්‍ය ගෘහස්ථ ඒක පුද්ගල ආදායම[ආ]
- (iii) විද්‍යා විෂය ධාරාවෙන් විශ්ව විද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය[ඈ]
- (iv) පළාතේ දිළිඳු ජන සංඛ්‍යාව[ඇ]
- (v) පළාතේ එක් වෛද්‍ය නිලධාරියෙකුට සිටින පුද්ගලයින් සංඛ්‍යාව[ඉ]
- (vi) උග්‍ර මන්දපෝෂණයෙන් (කෘෂ බවින්) පෙළෙන වයස අවුරුදු 05 ට අඩු දරුවන්ගේ ප්‍රතිශතය[ඊ]

අ, ආ, ඇ - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඈ - විභාග දෙපාර්තමේන්තුව
ඉ - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය ඊ - පවුල් සෞඛ්‍ය කාර්යාංශය

ඉහත විචල්‍යයන්වලට අදාළ දත්ත මත පදනම්ව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙනුවෙන් එහි නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය ජේ.එස්.එන්.පී. ධර්මවර්ධන මහතාගේ සහාය ඇතිව සාධක විශ්ලේෂණය (Factor Analysis) ලෙස හඳුන්වනු ලබන බහුවිචල්‍ය සංඛ්‍යානමය ක්‍රමවේදයක් (Multivariate Statistical Techniqe) භාවිතයෙන් එක් එක් පළාතට අදාළව සංයුක්ත දර්ශකයක් (Composite Index) සකස් කරන ලදි. එක් එක් පළාත තුළ ඇති දිස්ත්‍රික්ක අතර පවතින විෂමතාවයද ඉහළ බැවින්, සංයුක්ත දර්ශකය ගණනය කිරීමේදී ප්‍රථමයෙන් දිස්ත්‍රික් දර්ශකය සකස් කර, ඒ අනුව අදාළ පළාතේ දිස්ත්‍රික්කවල එකතුව ලබා ගැනීම මගින් පළාත් සංයුක්ත දර්ශකය ගණනය කර ඇත. මෙම ගණනය කිරීම සඳහා දැනට පවතින වඩාත් යාවත්කාලීන වූ දත්ත භාවිතා කර ඇති අතර, ඊට අදාළ දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, පවුල් සෞඛ්‍ය කාර්යාංශය, විභාග දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබා ගෙන ඇත. උක්ත විචල්‍යයන් අතුරින් (i), (iv), (v) සහ (vi) හි දැක්වෙන විචල්‍යයන් සංයුක්ත දර්ශකය සමඟ ධනාත්මක සහසම්බන්ධතාවයක් පෙන්නුම් කරන අතර, (ii) සහ (iii) න් දැක්වෙන විචල්‍යයන් සංයුක්ත දර්ශකය සමඟ සෘණාත්මක සහසම්බන්ධතාවයක් දක්වයි. එනම්, උදාහරණයක් වශයෙන් මාසික මධ්‍යන්‍ය ගෘහස්ථ ඒක පුද්ගල ආදායම ඉහළ අගයක් ගැනීමේදී, එය සංයුක්ත දර්ශකය සඳහා සෘණාත්මක බලපෑමක් ඇති කරයි. ඒ අනුව, අදාළ පළාත සඳහා අරමුදල් වෙන් කිරීමේ ප්‍රතිශතය සඳහා ඒක පුද්ගල ආදායම ඉහළ යාම සෘණාත්මකව බලපායි. ජන සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීමේදී, එය සංයුක්ත දර්ශකය සඳහා ධනාත්මකව බලපාන අතර, ඒ අනුව අදාළ පළාතට අරමුදල් වෙන් කිරීමේදී ජන සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම ධනාත්මකව ප්‍රතිඵලයක් ඇති කරයි.

එකී ක්‍රමවේදය භාවිතා කරමින් සකස් කරන ලද සංඛ්‍යානමය සූත්‍රය යොදා ගනිමින් 2026 වර්ෂය සඳහා රජයේ වාර්ෂික අයවැයෙන් පළාත් සඳහා වෙන් කරනු ලබන ප්‍රාග්ධන අරමුදල්වලින් පළාත් අතර බෙදා දිය යුතු ප්‍රතිශත අගයන් මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත. පළාත් අතර ප්‍රාග්ධන ප්‍රදාන බෙදා වෙන් කිරීම සඳහා යොදා ගන්නා ලද එකී ප්‍රතිශතයන් පහත 11 වන වගුවෙහි දක්වා ඇත.

**වගුව 11: එක් එක් පළාතේ සංයුක්ත දර්ශක අගයන් අනුව 2026 වර්ෂය සඳහා පළාත් අතර ප්‍රාග්ධන ප්‍රදාන බෙදා වෙන් කිරීම සඳහා ගණනය කරන ලද ප්‍රතිශතයන්**

| පළාත | සංයුක්ත දර්ශකය අනුව පළාත් ප්‍රතිශත අගය |
|---|---|
| බස්නාහිර | 9.24 |
| මධ්‍යම | 11.43 |
| දකුණු | 10.97 |
| උතුරු | 11.46 |
| වයඹ | 10.89 |
| උතුරු මැද | 11.28 |
| ඌව | 11.89 |
| සබරගමුව | 11.55 |
| නැගෙනහිර | 11.29 |
| **එකතුව** | **100.00** |

ඉහත විස්තර කෙරුණු සූත්‍රය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් අරමුණු සඳහා ගැලපෙන පරිදි මනා අධ්‍යයනයකින් පසුව සකස් කළ එකක් වුවද, එම සූත්‍රයේ ප්‍රයෝජනය ඉතා සීමිත වී ඇත. ඊට හේතුව, පළාත් සභා වෙත ලැබෙන (ඉහත සූත්‍රයට අනුව පළාත් වෙත වෙන් කරනු ලබන) ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කරනු ලබන අරමුදල්, රේඛීය අමාත්‍යාංශවලට ලැබෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන සමග සැසඳූ විට සාපේක්ෂව (දළ වශයෙන් මුළු ප්‍රාග්ධන වියදමෙන් 15%ක් තරම්) කුඩා වීමත් සාපේක්ෂව වැඩි ප්‍රතිපාදනයක් ලැබෙන රේඛීය අමාත්‍යාංශ විසින් විවිධ ප්‍රදේශවල රාජ්‍ය ආයෝජන සඳහා අරමුදල් වෙන්

කිරීමේදී පළාත් සභා විසින් භාවිතා කරන සූත්‍රයට සමාන වූ සූත්‍රයක් අනුගමනය නොකිරීමත් ය. එබැවින්, රේඛීය අමාත්‍යාංශ විසින් ද විවිධ ප්‍රදේශවලට අරමුදල් වෙන් කිරීමේදී මුදල් කොමිෂන් සභාව විසින් භාවිතා කරන සූත්‍රයට සමාන (මෙම සූත්‍රයම වීම අත්‍යවශ්‍ය නැත) සූත්‍රයක් භාවිතා කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ වෙත උපදෙස් නිකුත් කිරීම සුදුසු බව මෙම කොමිෂන් සභාව විසින් පසුගිය වසරේදී නිර්දේශ කරන ලදි.

කෙසේ වුවද, ඉහත සඳහන් ප්‍රතිශත අගයන් භාවිතා කරමින් මෙහි 3 වන පරිච්ඡේදයෙන් නිර්දේශිත මුදල් ප්‍රමාණයන් මත පදනම්ව 2026 වර්ෂය සඳහා පළාත් සභාවලට ප්‍රාග්ධන ප්‍රදාන අවශ්‍යතාවය ලෙස පහත අංක 12 වගුවෙහි දැක්වෙන ප්‍රමාණයන් බෙදා වෙන් කිරීමට මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

**වගුව 12: 2026 වර්ෂය සඳහා ගණනය කරන ලද ප්‍රතිශත අනුව එක් එක් පළාත සඳහා නිර්දේශිත ප්‍රාග්ධන අරමුදල් බෙදා වෙන් කර දීම**

| පළාත | නිර්දේශිත ප්‍රාග්ධන ප්‍රදාන (රු.මි.) | | නිර්දේශිත මුළු ප්‍රාග්ධන ප්‍රදාන (රු.මි.) | ප්‍රාග්ධන ප්‍රදානයේ පළාත් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | උපමාන පාදක ප්‍රදාන | | |
| බස්නාහිර | 12,197 | 1,386 | 13,583 | 9.24 |
| මධ්‍යම | 15,088 | 1,715 | 16,803 | 11.43 |
| දකුණු | 14,480 | 1,645 | 16,125 | 10.97 |
| උතුරු | 15,127 | 1,719 | 16,846 | 11.46 |
| වයඹ | 14,375 | 1,633 | 16,008 | 10.89 |
| උතුරු මැද | 14,889 | 1,692 | 16,581 | 11.28 |
| ඌව | 15,695 | 1,784 | 17,479 | 11.89 |
| සබරගමුව | 15,246 | 1,733 | 16,979 | 11.55 |
| නැගෙනහිර | 14,903 | 1,693 | 16,596 | 11.29 |
| **එකතුව** | **132,000** | **15,000** | **147,000** | **100.00** |

මුදල් කොමිෂන් සභාව පෙර වසරේදී මෙන්ම 2026 වර්ෂය සඳහා ද පළාත් වෙත විමධ්‍යගත කර ඇති ආදායමෙන් කොටසක් පළාත් ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා සඳහා ගලපා ගැනීමට නිර්දේශ කරන අතර, ඒ අනුව, 2026 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත සමස්ත ආදායම් ඉලක්කයෙන් 50%ක් ප්‍රාග්ධන වියදම් සඳහා ගලපා ගැනීම මැනවැයි නිර්දේශ කරනු ලැබේ. (මෙම වාර්තාවේ 3.2හි යෝජිත පරිදි ප්‍රාග්ධන ප්‍රතිපාදන පළාත් ආදායමට හිලව් කරන්නේ නම්) එසේ ගැලපීමෙන් පසු පළාත් වෙත නිර්දේශ කරනු ලබන ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණයන් වගුව 13 හි දැක්වේ.

වගුව 13: පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සමග ආදායම් ඉලක්ක ගැළපීමෙන් පසු 2026 වර්ෂය සඳහා නිර්දේශිත ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රමාණයන්

| පළාත | නිර්දේශිත ප්‍රාග්ධන ප්‍රදාන (රු. මි.) | | |
|---|---|---|---|
| | ආදායම් ගැළපීමෙන් පසු පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | උපමාන පාදක ප්‍රදාන | එකතුව |
| බස්නාහිර | 9,767.00 | 1,386.00 | 11,153.00 |
| මධ්‍යම | 12,977.00 | 1,715.00 | 14,692.00 |
| දකුණු | 12,415.00 | 1,645.00 | 14,060.00 |
| උතුරු | 13,564.00 | 1,719.00 | 15,283.00 |
| වයඹ | 12,142.00 | 1,633.00 | 13,775.00 |
| උතුරු මැද | 12,835.00 | 1,692.00 | 14,527.00 |
| ඌව | 14,197.00 | 1,784.00 | 15,981.00 |
| සබරගමුව | 13,151.00 | 1,733.00 | 14,884.00 |
| නැගෙනහිර | 13,599.50 | 1,693.00 | 15,292.50 |
| **එකතුව** | **114,647.50** | **15,000.00** | **129,647.50** |

යෝජිත පරිදි එක් එක් පළාතේ ප්‍රාග්ධන වියදම් පළාත් ආදායමට හිලව් කිරීම පිළිබඳව විස්තර 1 වන ඇමුණුමේ දැක්වේ.

### 4.1.2 2026 ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳව මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ හා රජය විසින් තීරණය කරන ලද අනුගම්‍ය වියදම් සීමාවන්

මුදල් කොමිෂන් සභාව විසින් විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කරමින් පළාත් සභා සඳහා 2026 වර්ෂය සඳහා වන ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහත සඳහන් පරිදි නිර්දේශ කරන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (3) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමිනි. එසේ වුවද, 2025-2030 සඳහා වන මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට අනුගතව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ ප්‍රතිපාදන අනුව 2026 වර්ෂය සඳහා පළාත් සභාවන්හි ප්‍රාග්ධන ප්‍රදාන සඳහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති අනුගම්‍ය ප්‍රදාන සීමාව රු.බිලියන 77 ක් වේ. (එකී මුදල මෙම කොමිෂන් සභාව විසින් එක් එක් පළාත් සභාව සඳහා නිර්දේශ කරනු ලබන අනුපාතයන්ට ගලපා 2026 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පතේ දක්වා ඇත) එකී අනුගම්‍ය ප්‍රදාන සීමාව මුදල කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මුදලින් 52% ක් පමණක් වුවද, මීට ඉහත වර්ෂවලදී අයවැයෙන් ලබා දුන් මුදල සමඟ සසඳන විට මෙවර වෙන් කර දී ඇති මුදල සාපේක්ෂව ඉහළ අගයක් ගනී. (නිදසුනක් වශයෙන් ගත් කල්හි 2019 - 2024 කාලයේදී අයවැයෙන් ලබා දුන් මුදල එකී වර්ෂ සඳහා කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මුදලෙන් සාමාන්‍යයෙන් 26 % පමණ විය). මේ තත්ත්වය යටතේ ඉහත කී අනුගම්‍ය ප්‍රදාන සීමාවන් පදනම් කරගෙන 2026 වර්ෂය සඳහා වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කළ යුතු බවට කොමිෂන් සභාව විසින් පළාත් ප්‍රධාන ලේකම්වරුන්ට උපදෙස් දෙන ලදි.

#### 4.1.3 2026 වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් දැරීම කල් තබා සැලසුම් කිරීම

මීට ඉහතදී සෑම වර්ෂයකම පළාත් සභා සඳහා අයවැයෙන් වෙන් කර දෙනු ලැබූ මුදල පළාත් සභා වෙත දන්වන ලද්දේ පාර්ලිමේන්තුව විසින් අදාළ වර්ෂ සඳහා වන විසර්ජන පනත සම්මත කිරීමෙන් පසුව වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාළව මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ ද සමඟය. එකී මාර්ගෝපදේශ අනුව පළාත් සභා බලධාරීන් විසින් සකස් කරනු ලබන වාර්ෂික සංවර්ධන සැලසුම් මුදල් කොමිෂන් සභාව වෙත ලැබීමෙන් පසු මෙම වාර්තාවේ 2 වන පරිච්ඡේදයේ 2.2 ඡේදයේ සඳහන් වන ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමෙන් පසුව මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කරනු ලබන සංශෝධනද සමඟින් කොමිෂන් සභාවේ එකඟතාවය පළාත් බලධාරීන් වෙත දන්වා යවනු ලබන්නේ මාර්තු මාසයේ දී ය. ඒ තත්ත්වය යටතේ වාර්ෂික සංවර්ධන සැලැස්ම (අවිච්ඡේද ක්‍රියාකාරකම් හැර) ක්‍රියාත්මක කිරීමට අවුරුද්දෙන් ඉතිරිව ඇති කාලය මාස 9 ක් පමණි. (රේඛීය අමාත්‍යාංශ විසින් ඒ අන්දමේ ක්‍රියාපටිපාටි අනුගමනය නොකළ ද අයවැය යෝජනාවලින් එකී ආයතන වෙත ලබා දුන් ප්‍රතිපාදන යොදා ගනිමින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල / දිස්ත්‍රික් කාර්යාල වෙත උපදෙස් යැවෙනුයේද මෙම වකවානුතුළමය).

අතීතයේදී කල්වේලා ඇතිව ඉදිරි වර්ෂය සඳහා වන ප්‍රතිපාදන සීමාවන් පළාත් සභා බලධාරීන් වෙත දැන්වීම අපහසු වූයේ මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබූ මුදලින් කොපමණ ප්‍රතිශතයක් අයවැයෙන් වෙන් වන්නේද යන්න වාර්ෂික විසර්ජන පනත සම්මත වනතෙක් කල්තබා පුරෝකථනය කළ නොහැකි වීම නිසා ය. එසේ වුවද, 2026 වසරේ සිට පළාත් සභාද ඇතුළුව එක් එක් රාජ්‍ය ආයතනය වෙත වෙන් කරන ලද මුදල රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 15 වන වගන්තිය අනුව කල්තබා තීරණය කර, වාර්ෂික විසර්ජන පනත් කෙටුම්පතට එම මුදලම ඇතුළත් කර ඇති හෙයින් 2026 වර්ෂය සඳහා පළාත් සභා වෙත වෙන් කරනු ලබන මුදල කොපමණද යන්න විශ්වසනීය ලෙස පළාත් සභා වෙත දැන්වීමට දැන් ඉඩ ලැබී ඇත. එබැවින්, එළඹෙන වර්ෂය සඳහා වූ වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදානය පිළිබඳව පළාත් සභා කල්තබා දැනුවත් කොට එකී ආයතනවල සැලසුම් ක්‍රියාවලිය ඉක්මනින් ඇරඹීම කොමිෂන් සභාවේ අපේක්ෂාව වූ අතර ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පළාත් සභා අයවැය පිළිබඳව 2025 සැප්තැම්බර් 11 වන දින ජනාධිපති කාර්යාලයේදී පවත්වන ලද රැස්වීමේදී ඉහත කී පරිදි කටයුතු කරන බව සභාපතිවරයා විසින් දන්වා සිටින ලදි.

ඒ අනුව, 2026 වර්ෂය සඳහා පළාත් සභා වෙත වාර්ෂික අයවැයෙන් වෙන් කිරීමට අපේක්ෂිත මුදල, ඉහත 4.1.1 ඡේදයේ සඳහන් කරන ලද පරිදි කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ප්‍රතිශත අනුව පළාත් සභා අතර වෙන් කර දෙන ලදි. එකී ප්‍රතිපාදන යොදා ගනිමින් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කළ යුතු ආකාරය පිළිබඳ ඔවුන් වෙත යොමු කළ මාර්ගෝපදේශ අනුගමනය කරමින් 2026 වර්ෂය සඳහා වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කරන ලෙස පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත 2025.10.07 දිනැති ලිපිය මගින් දන්වන ලදි.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වගකීම් පනතෙන් අවධාරණය කර ඇති පරිදි රාජ්‍ය ආයෝජනයන්හි උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා සංවර්ධන සැලසුමට ඇතුළත් කෙරෙන සෑම ව්‍යාපෘතියක්ම/ ක්‍රියාකාරකමක්ම (පළාත් මූල්‍ය ප්‍රඥප්තීන්හි දැනටමත් ඇතුළත් ප්‍රතිපාදන අනුව) නිසි ඇගයීමකට ලක්කිරීම අනිවාර්ය බවත්, එසේ කළ බවට ප්‍රධාන ලේකම් ප්‍රකාශයක් ඇතුළත් කළ යුතු බවටත් මෙවර උපදෙස් දී ඇත.

ඒ අනුව, එක් එක් පළාත් සභාව වෙත වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රදානයන් කොපමණද යන්න පහත දැක්වෙන වගුවේ සඳහන් වේ. (ඒ අනුව එක් එක් පළාත් සභාව වෙත වෙන වෙනම දන්වන ලද අතර, බස්නාහිර පළාත් සභාව වෙත යොමු කරන ලද එම මාර්ගෝපදේශයන් ඇතුළත් 2025.10.07 දිනැති ලිපිය ඇමුණුම II ලෙස මීට අමුණා ඇත.)

ඉහත සඳහන් මාර්ගෝපදේශ අනුව, 2026 වර්ෂය සඳහා පළාත් සභා විසින් සකස් කරනු ලබන වාර්ෂික සැලසුම් 2025 නොවැම්බර් 15 දිනට පෙර මුදල් කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස ප්‍රධාන ලේකම්වරුන්ට උපදෙස් දී ඇති අතර, එකී සැලසුම් අදාළ සියළු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන්

සමාලෝචනය කොට එකී වාර්ෂික සංවර්ධන සැලසුම් සඳහා 2025.12.31 දිනට ප්‍රථම මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා දීමට සැලසුම් කර ඇත.

**වගුව 14: 2026 අයවැයෙන් පළාත් සභාවලට වෙන් කරනු ඇතැයි පුරෝකථනය කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන).**

**(රු.මි.)**

| පළාත | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | උපමාන පාදක ප්‍රදාන | එකතුව |
|---|---|---|---|
| බස්නාහිර | 6,403 | 600 | 7,003 |
| මධ්‍යම | 7,921 | 743 | 8,664 |
| දකුණු | 7,602 | 713 | 8,315 |
| උතුරු | 7,942 | 745 | 8,687 |
| වයඹ | 7,547 | 708 | 8,255 |
| උතුරු මැද | 7,817 | 733 | 8,550 |
| ඌව | 8,240 | 773 | 9,013 |
| සබරගමුව | 8,004 | 751 | 8,755 |
| නැගෙනහිර | 7,824 | 734 | 8,558 |
| **එකතුව** | **69,300** | **6,500** | **75,800** |

### 4.2 පළාත් සභා සඳහා සාමූහික ප්‍රදානයන් නිර්දේශ කිරීම

පළාත් සභා සඳහා ලබාදෙන සාමූහික ප්‍රදානය, අදාළ පළාත් සභාවේ ඇස්තමේන්තුගත ආදායම, රජයෙන් පළාත් සභා වෙත මාරු කරන ආදායම හා පළාත් සභා සඳහා අවසන් වශයෙන් තක්සේරු කරන පුනරාවර්තන වියදම් අවශ්‍යතාවය මත සම්පූර්ණයෙන්ම රඳා පවතී.

විචක්ෂණශීලී ආකාරයකින් පුනරාවර්තන වියදම් සැලසුම් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් මුදල් කොමිෂන් සභාව විසින් 2025 මාර්තු 07 වන දින නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුව පළාත් සභාවන් විසින් ඉදිරිපත් කරන ලද පුනරාවර්තන අයවැය අවශ්‍යතා පිළිබඳ සළකා බැලීමෙන් අනතුරුව පුනරාවර්තන අවශ්‍යතා සහ පළාත් විමධ්‍යගත ආදායම් ඉලක්කයන් තක්සේරු කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් අදාළ පළාත් බලධාරීන්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡා මාලාවක් සංවිධානය කරන ලදි.

පළාත් සභා සඳහා දෙනු ලබන පුනරාවර්තන ප්‍රදානය තීරණය කිරීමේ අවසන් ක්‍රියාවලියේදී, මෑතකදී රේඛීය අමාත්‍යාංශ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ සහ පළාත් අයවැය සාකච්ඡා මගින් ගනු ලැබූ තීරණයන් ද සලකා බලන ලදි.

### 4.3 පළාත් ආදායම ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් හා ගැලපීම

සාමාන්‍යයෙන් මහා භාණ්ඩාගාරය විසින් පළාත් ආදායම සාමූහික ප්‍රදානය සමඟ ගැලපුවද, පළාත් සභා පිහිටුවීමේ හා ඇතැම් ආදායම් මූලාශ්‍ර පළාත් සභා වෙත පැවරීම සඳහා වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවල අරමුණ එය නොවේ.

එබැවින්, 2023 හා 2024 වසරවලදී මුදල් කොමිෂන් සභාව විසින්, පළාත් විමධ්‍යගත ආදායම පළාත් ප්‍රාග්ධන ප්‍රදානය සමග ගලපා පළාත් තුළ තුලිත සංවර්ධනයක් ඇති කිරීමට තරයේ නිර්දේශ කරන ලදි. එම නිර්දේශයන් ගරු ජනාධිපතිතුමා හා කැබිනට් මණ්ඩලය විසින් පිළිගන්නා ලැබුවද 2025 වසරේදීද එය ක්‍රියාත්මක නොවීය. පළාත් පාලන ආයතනවලට මාරු කෙරෙන මුද්දර ගාස්තු හා උසාවි දඩ හැර 2026 වසර සඳහා පළාත් ආදායම් ඉලක්කය රු. මිලියන 34,704.5 ක් වේ. පළාත් ආදායම සම්පූර්ණයෙන්ම පළාත් පුනරාවර්තන වියදම් සමඟ ගැලපීම වෙනුවට 2026 වසර සඳහා ඉන් 50% ක් ප්‍රාග්ධන ප්‍රදානය සමග ද ඉතිරි 50% ප්‍රමාණය පුනරාවර්තන වියදම් සමඟද ගැලපීමට මුදල් කොමිෂන් සභාව විසින් මෙවරද නිර්දේශ කර ඇත.

සම්පත් ප්‍රවාහය පළාත් සභා අතර තාර්කිකව බෙදා දී ඇති බැවින් මෙම යෝජනාව මගින් කිසිඳු පලාතකට විශේෂ වාසියක් අත් නොවන බවට (මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන සම්පූර්ණ ප්‍රාග්ධන ප්‍රදානය හා ඒ සමඟ ගලපන ලද පළාත් ආදායමේ එකතුව මුළු ප්‍රාග්ධන ප්‍රදානය වන බැවින්) මුදල් කොමිෂන් සභාවට තහවුරු කළ හැක.

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (3) අනු වගන්තිය අනුව, මහා භාණ්ඩාගාර නිලධාරීන් ඇතුළු අදාළ සියළුම පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් පළාත් සභා සඳහා ප්‍රමාණවත් අරමුදල් පිළිබඳව කරනු ලැබූ තක්සේරුව පදනම් කරගෙන 2026 වර්ෂයේදී පුනරාවර්තන වියදම් වශයෙන් පළාත් සභාවලට ලබා දිය යුතු සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 692,416ක් ලෙස මුදල් කොමිෂන් සභාවේ අංක FC/RCA/GEN/06/01/2026 හා 2025.08.14 දිනැති ලිපිය මගින් මහා භාණ්ඩාගාරය වෙත නිර්දේශ කර යවන ලදි.

එසේ වුවද, 2026-2030 මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව තුළ 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ නියමයන්ට අනුකූලව, මහා භාණ්ඩාගාරය විසින් නිශ්චිතව දක්වා ඇති වියදම් සීමාව අනුව පළාත් සභා වෙත 2026 වර්ෂයට පුනරාවර්තන වියදම් සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන සීමා පිළිබඳව මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් දන්වා තිබිණ. එකී අනුගම්‍ය ප්‍රතිපාදන සීමාවන් (binding ceilings) 2026 වර්ෂය සඳහා කෙටුම්පත් කර ඇති විසර්ජන පනත් කෙටුම්පතටද ඇතුළත් කර ඇති අතර ඒ අනුව, පළාත් සභා වෙත වාර්ෂික අයවැයෙන් වෙන් කරනු ඇතැයි සඳහන් සාමූහික ප්‍රදාන රුපියල් මිලියන 533,000ක් වේ.

කෙසේ නමුත්, පුරෝකථනය කරනු ලැබූ පළාත් අදායම් ගැළපීමෙන් අනතුරුව මුදල් කොමිෂන් සභාව විසින් මනා ඇගැයීමකින් කරනු ලැබූ නිර්දේශයට වඩා අඩු ප්‍රතිපාදන ප්‍රමාණයක් (අනුගම්‍ය ප්‍රතිපාදන ලෙස) පළාත් සභා වෙත වෙන් කර දීම හේතුවෙන් පහත සඳහන් ගැටළු ඉදිරියේදී පැන නැගීමට ඉඩ තිබේ.

(i) අනුමත කාර්යමණ්ඩලය තුළ කරනු ලබන නව පත්වීම් සඳහා වැටුප් ගෙවීමට අතිරේක ප්‍රතිපාදන ලබා දීමට සිදු වීම.

(ii) ජාතික මට්ටමෙන් නව පත්වීම් ලබා දී පළාත් සභාවලට අනුයුක්ත කරනු ලබන කාර්යමණ්ඩල සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා දීමට සිදු වීම.

(iii) අතිකාල දීමනා විශේෂයෙන් සෞඛ්‍ය අංශයේ අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ලබා දීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.

(iv) පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට ණය පහසුකම් ලබා දීමට අපහසු වීම මත විවිධ ගැටළුවලට ඉදිරියේදී මුහුණ දීමට සිදු වීම (මෙම පහසුකම අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ට ලැබී ඇත).

(v) හිඟ වැටුප් ගෙවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.

(vi) පාසල්වල ජල හා විදුලි බිල්පත් ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම.

(vii) පළාත් ආයතන පවත්වාගෙන යාමේදී අවශ්‍ය වන සේවා සඳහා ගෙවීම කිරීමේදී ගැටළු මතු වීම.

(viii) ගොඩනැගිලි හා ඉදිකිරීම්වල නඩත්තු කටයුතු නිසියාකාරව ඉටු කර ගැනීමට දුෂ්කර වීම.

ඒ අනුව, 2026 වර්ෂය තුළ දෛනික පළාත් රාජ්‍ය සේවාවන් සහ නව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මතුවිය හැකි ඉහත සඳහන් තත්ත්වයන් පිළිබඳව ද සැලකිලිමත් වීම යෝග්‍ය බව මුදල් කොමිෂන් සභාවේ මතයයි.

# 5 වන පරිච්ඡේදය

## විශේෂ නිර්දේශ

පළාත් සභාවන් වෙත පැවරුණු කාර්යභාරය වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වනු පිණිස රජයේ සමස්ත සංවර්ධන උපායමාර්ගයට අනුපූරක වන පරිදි රජය විසින් ක්‍රියාත්මක කිරීම මැනවැයි හැඟෙන නිර්දේශ කිහිපයක් මෙම පරිච්ඡේදයේ ඇතුළත් වේ.

**(1) කල්වේලා ඇතිව සැලසුම් කිරීම තුළින් 2026 වසර තුළ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීම.**

අපට දැනගන්නට ලැබී ඇති තොරතුරු අනුව, 2025 වර්ෂය සඳහා පළාත් සභා වෙත ලබා දුන් ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙනුත් රේඛීය අමාත්‍යාංශ වෙත වෙන්කරන ලද අයවැය ප්‍රතිපාදනවලිනුත් වැය කර ඇත්තේ සාපේක්ෂව අඩු ප්‍රතිශතයකි. මීට බලපා ඇති එක් ප්‍රධාන කරුණක් වන්නේ ඉහත කී ආයතන විසින් 2025 වර්ෂය සඳහා වූ ව්‍යාපෘති සැලසුම් කිරීම ආරම්භ කරන ලද්දේ මෙම වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමෙන් පසුව, එනම් 2025 මාර්තු 21 දිනෙන් පසුව වීමයි. මීට ඉහත අවුරුදු සම්බන්ධයෙන් බලන විටද පෙනී යන දුර්වලතාවය වනුයේ එකී ආයතන විසින් සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පූර්ව සූදානමක් නොමැති වීමයි. එළඹෙන වසර සඳහා (පළාත් සභාද ඇතුළු) එක් එක් රාජ්‍ය ආයතන වෙනුවෙන් සැලසෙන ප්‍රතිපාදන සම්බන්ධයෙන් එකී වසරට අදාළ විසර්ජන පනත් කෙටුම්පතේ සඳහන් තොරතුරු පවත්නා වසරේ 4 වන කාර්තුව වන විට ප්‍රසිද්ධියට පත් කෙරෙන නිසා එකී තොරතුරු යොදාගෙන එළඹෙන වසර සඳහා වන සංවර්ධන සැලසුම් කල්වේලා ඇතිව සම්පාදනය කර ගැනීම මෙම දුර්වලතාවය නිවැරදි කර ගැනීම සඳහා එක් විසඳුමක් විය හැකිව තිබිණ. එසේ වුවද, රාජ්‍ය මූල්‍ය පිළිබඳව පූර්ණ බලය සතු පාර්ලිමේන්තුව විසින් විසර්ජන පනත් කෙටුම්පතේ සඳහන් ප්‍රතිපාදන ඒ අයුරින්ම සම්මත කරනු ඇතැයි යන්න පිළිබඳව තහවුරුවක් නොමැති වීම හේතුවෙන් එකී තොරතුරු වඩාත් විශ්වසනීයභාවයකින් යුතුව සැලසුම්කරණය සඳහා යොදා ගැනීමට අපහසු වීම මේ තත්ත්වය කෙරෙහි බලපා ඇත.

එසේ වුවද, 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත 2026 වර්ෂයට අදාළව දැන් ක්‍රියාත්මක වන බැවින් එකී පනතේ 15 වන වගන්තියට අනුව දැනටමත් මහා භාණ්ඩාගාරය විසින් තීරණය කර ඇති අනුගම්‍ය වියදම් සීමාවන් (binding ceilings) අනුව, විසර්ජන පනත් කෙටුම්පතේ ප්‍රතිපාදන සලසා ඇති බැවින් පාර්ලිමේන්තුවේ අනුමැතියට යටත්ව එකී පනත් කෙටුම්පතේ දක්වා ඇති වියදම් සීමාවන් වඩාත් විශ්වසනීය ලෙස 2026 වර්ෂයේ සැලසුම් සඳහා පාදක කර ගැනීමට දැන් අවකාශ ඇත.

ඉහත කී සුවිශේෂී තත්ත්වය සැලකිල්ලට ගනිමින් පළාත් සභා වෙත දැනටමත් (අනුගම්‍ය ප්‍රතිපාදන ලෙස) වෙන්කර ඇති මුළු ප්‍රතිපාදනය පළාත් සභා අතර වෙන් කරලීම සඳහා කොමිෂන් සභාව විසින් මෙම වාර්තාවේ 4.1.1 ඡේදය අනුව නිර්දේශ කරනු ලැබ ඇති ප්‍රතිශත අනුව, පළාත් සභා වෙත වෙන් කර දෙන ලද අතර 2026 වර්ෂය සඳහා වූ වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ මුදල් කොමිෂන් සභාව විසින් 2025 ඔක්තෝබර් 07 දිනැති ලිපියෙන් පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත යොමු කරන ලදි. එකී මාර්ගෝපදේශ අනුව සකස් කරනු ලබන වාර්ෂික සංවර්ධන සැලසුම් 2025.11.15 දිනට පෙර මුදල් කොමිෂන් සභාව වෙත එවිය යුතු අතර, අදාළ සියළුම පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එකී සැලසුම් සමාලෝචනය කොට ඒවා සඳහා මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය 2025.12.31 දින වන විට ලබා දීමට සැලසුම් කර ඇත. (කරුණාකර මෙම වාර්තාවේ 4.1.2 ඡේදය බලනු මැනවි).

රේඛීය අමාත්‍යාංශ සඳහා ද ඉහත සඳහන් ක්‍රමවේදය යොදා ගන්නේ නම් 2026 වර්ෂය සඳහා භාණ්ඩාගාරය විසින් දැනටමත් දන්වා ඇති අනුගම්‍ය ප්‍රතිපාදන පදනම්ව එම වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති එකී අමාත්‍යාංශවලට කල් තබා සැලසුම් කර ගත හැකි වනු ඇත. එක් එක් වර්ෂය සඳහා රේඛීය අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති කල්වේලා ඇතුව හඳුනාගෙන ඒවා පළාතේ වාර්ෂික

සංවර්ධන සැලැස්මට ඇතුළත් කර ද්වීකරණය වැළැක්වීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් අතීතයේදී ගනු ලැබූ උත්සාහය සාර්ථක නොවූයේ එකී රේඛීය අමාත්‍යාංශ බොහොමයක් විසින්, කල්වේලා ඇතිව වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් නොකිරීම හේතුවෙනි. එබැවින්, මෙම ඡේදයේ සඳහන් කළ පරිදි පළාත් සභා සම්බන්ධයෙන් 2026 වර්ෂයට අදාළව ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩ පිළිවෙල රේඛීය අමාත්‍යාංශ සඳහා ද අදාළ කර ගන්නේ නම් රේඛීය අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරනු ලබන එකී ව්‍යාපෘති පළාත් සභා සංවර්ධන සැලසුම්වලට මැනවින් ඒකාබද්ධ කිරීම තුලින් ද්වීකරණය වළකා වඩාත් කාර්යක්ෂම ලෙස රාජ්‍ය ආයෝජන උපයෝජනය කිරීමට ඉඩ සැලසෙනු ඇත. රේඛීය අමාත්‍යාංශවලටද මෙමගින් සැලසෙන සුවිශේෂී වාසිය නම් වර්ෂයට අදාළ ප්‍රතිපාදනවලින් වැඩි ප්‍රතිශතයක් උපයෝජනය කිරීමට හැකි වීමයි.

## (2) ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යවසාය සංවර්ධනයේ දී ජාතික මට්ටමෙන් හා පළාත් මට්ටමෙන් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් සමගාමී අයුරින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය

පළාත් සභා වෙත පැවරී ඇති කෘෂිකර්ම හා පශු සම්පත් වැනි විෂයයන්ට අදාළ ක්ෂුද්‍ර හා කුඩා පරිමාණයේ ජීවනෝපාය සංවර්ධන වැඩපිළිවෙල්වලින් බහුතරයක්ම ක්‍රියාත්මක කෙරෙනුයේ එකී කටයුත්තෙහි පිරිවැයෙන් 50% ක් (ආපසු අය නොකරන) ආධාරයක් ලෙස පළාත් සභාවෙන් ලබාදීමේත් ඉතිරි 50% ප්‍රතිලාභියා විසින් දැරීමේත් පදනම මත ක්‍රියාත්මක වන වැඩසටහන් ලෙස ය. පළාත් සභා බලධාරීන්ගෙන් ලබාගත් තොරතුරු විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ එක් එක් විෂය සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන යොදවා මෙම වැඩපිළිවෙළ වැඩි වශයෙන්ම ක්‍රියාත්මක වී ඇත්තේ කෘෂිකර්ම, සත්ත්ව පාලනය, ධීවර, කුඩා කර්මාන්ත, ග්‍රාමීය සංවර්ධන, සමුපකාර වැනි විෂයයන් සඳහා බවය. ගැමි ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය අරමුණු කර ගත් මෙම වැඩ පිළිවෙළ තුළින් නව තාක්ෂණය හා නව වගා ක්‍රම හඳුන්වා දීම වැනි අරමුණු ඉටු කර ගැනීමට ද අපේක්ෂා කරන ලදි.

පළාත් සභාවලින් ලබා ගත් තොරතුරු අනුව, නිරීක්ෂණය වන්නේ කෘෂිකර්ම, පශු සම්පත් හා මිරිදිය ධීවර අංශවලට පළාත් නිශ්චිත ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලබාදුන් ප්‍රතිපාදනයෙන් ආසන්න වශයෙන් 30% ක් පමණ මෙම වැඩසටහන්වලට වෙන් කර ඇති බවයි. එමෙන්ම, ග්‍රාමීය සංවර්ධන, කුඩා කර්මාන්ත හා සමුපකාර සංවර්ධන අංශවල සමස්ත ප්‍රතිපාදනයෙන්ද 7%-10% ක ප්‍රමාණයක් මෙවැනි වැඩසටහන්වලට වෙන් කර ඇත.

කෘෂිකර්ම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත් කල්හි උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාදීම, කෘෂි ළිං ඉදිකිරීම, විදුලි ජනක යන්ත්‍ර ලබාදීම, වැසි ආවරණ ඉදිකිරීම, පැරෂූට් තැටි ලබාදීම, කෘෂි සැකසුම් හා ඇසුරුම් යන්ත්‍ර ලබාදීම, ආරක්ෂිත වැට ඉදිකිරීම, වායු රයිෆල් ලබාදීම, ආරක්ෂිත ගෘහ තුළ වගාව සඳහා ද්‍රව්‍ය ලබාදීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP - Good Agricultural Practice) හඳුන්වා දීම, ජල සම්පාදන උපකරණ ලබාදීම ආදිය ඇතුළත් විය. සත්ත්ව පාලන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත් කල්හි කුකුල් පාලනය, කිරි ගව පාලනය, සූකර පාලනය හා එළු ගොවිපොළ සංවර්ධන ක්ෂේත්‍ර ඇතුළත් විය. මීට අතිරේකව මිරිදිය ධීවර කර්මාන්තය යටතේ ඔරු, දැල් ආදී ධීවර ආම්පන්න ලබාදීම, විසිතුරු මත්ස්‍ය වගාව, කුඩා කර්මාන්ත සහ වෙනත් ස්වයං රැකියා සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ සුළු පරිමාණ කර්මාන්ත සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ ලබාදීම ද සිදු විය.

මෙබඳු වැඩසටහන් ඒකාකාරී ලෙස සෑම අවුරුද්දකම ක්‍රියාත්මක කිරීම කෙතරම් දුරට ඵලදායී වන්නේ ද යන්න ගැන පළාත් සභාවන්හි වාර්ෂික සංවර්ධන සැලසුම් පිළිබඳව සිදු කරන ලද සමාලෝචන රැස්වීම්වල දී දීර්ඝ වශයෙන් සාකච්ඡා විය. එහිදී පැහැදිළි වූ කරුණක් නම් අපේක්ෂිත පරිදි නව තාක්ෂණය ප්‍රචලිත නොවූ බවත්, පළාත් සභාව විසින් ඍජු මූල්‍ය ආධාර ලබාදීමෙන් ඉවත් වූ විට යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) ගොවීන් විසින් අත්හැර දමන ලද බවත් ය. එකී සාකච්ඡාවල දී පහත සඳහන් තත්ත්වයන් නිරීක්ෂණය විය.

i. පළාත් සභා විසින් ලබාදෙන 50% දායකත්වය ආපසු අය කර නොගන්නා ආධාරයක් බැවින් හුදෙක් එම ආධාරය ලබා ගැනීමේ අරමුණින්ම බොහෝ පිරිසක් ඊට සම්බන්ධ වුවත්, ඔවුන් බොහෝ දෙනෙකුට එම කාර්යය සඳහා සැබෑ අවශ්‍යතාවයක් හෝ ඒ සඳහා කැපවීමක් නොතිබූ බව හා අදාළ ක්‍රියාකාරකමට ව්‍යාපාරික සැලැස්මක් හා හැකියාවක් ඔවුන් සතු නොවීම.

ii. අපේක්ෂිත පරිදි ආදායම් උත්පාදනයට අසමත් වූ ඇතැම් ව්‍යාපෘති/ක්‍රියාකාරකම් සඳහා තමා සතු පෞද්ගලික මුදල් ද ඒ වෙනුවෙන් යොමු කිරීම නිසා ප්‍රතිලාභීන්ට එකී කාර්යයන් ආර්ථික වශයෙන් ඵලදායී නොවන ක්‍රියාකාරකම් බවට පත්වීම.

iii. රජයේ සහනාධාරය එකී ක්‍රියාකාරකමේ පිරිවැය ගණන් බැලීමේ දී ප්‍රතිලාභීන් විසින් ගණන් නොබැලීම නිසා එම ක්‍රියාකාරකම ලාභදායී නොවූ අවස්ථාවල දී පවා ලාභදායී එකක් ලෙස පෙනී යාම.

iv. පළාත් සභා විසින් 50% දායකත්වය ලබා දෙනුයේ කලින් තීරණය කරන ලද උපරිමයකට යටත්ව බැවින් ව්‍යවසායකයන් ලෙස දියුණු වීමට විභවතාවයක් ඇති එහෙත් ප්‍රාග්ධනය සපයා ගත නොහැකි අයට තම කටයුතු ලාභදායී නොවන පරිමාණයකට සීමා කිරීමට සිදුවීම (එහෙත් ණය මුදලක් ලෙස මෙම මූල්‍යාධාරය ලබාදෙන්නේ නම් ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම වෙනුවෙන් දැරිය යුතු මුළු වියදම වුවද ප්‍රතිලාභියාට ලබාදීමට ඉඩ සැලසෙනු ඇත).

පසුගිය වසර 05 ක කාලය තුළ පළාත් සභා විසින් (2021-2025) 50% රජයේ සෘජු දායකත්වය යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල රජයේ දායකත්වය රු.මිලියන 4,600 ක් පමණ වේ. ඉන් ගම්‍ය වන්නේ එම ප්‍රමාණයම හෝ ඊට වැඩි දායකත්වයක් එම ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් විසින් ද දරා ඇති බවයි.ඒ අනුව, එම ව්‍යාපෘති අපේක්ෂිත අයුරින් සාර්ථක නොවීම තුළින් රජයේ දායකත්වය මෙන්ම ප්‍රතිලාභීන් විසින් දරනු ලැබූ දායකත්වයද අපතේ යෑමක් සිදුවේ.

එබැවින්, මෙම වැඩපිළිවෙළ ඒකාකාරී ලෙස නැවත නැවත ක්‍රියාත්මක කිරීමට පෙර ඒවායේ සාර්ථකත්වය පිළිබඳව ඇගයීමක් කිරීම යෝග්‍ය බව පළාත් සභා බලධාරීන්ට පෙන්වා දෙන ලදි. ඒ අනුව සබරගමුව පළාත් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද ක්ෂුද්‍ර/කුඩා පරිමාණයේ ගෘහාශ්‍රිත කුකුල් පාලන ව්‍යාපෘති පිළිබඳව විද්‍යාත්මක පදනමක් මත ඇගයීමක් කර ඇති අතර එමගින් ද ඉහත සඳහන් නිරීක්ෂණ සනාථ වන බව පෙනේ. පසුගිය වසරවලත් විශේෂයෙන්ම 2025 වර්ෂයේ සංවර්ධන සැලැස්ම සම්බන්ධයෙන් වූ සාකච්ඡාවලදීත් ඉහත කී ප්‍රතිලාභ දායකත්ව වැඩපිළිවෙළ වෙනුවට රජයේ ආධාරය පොළී රහිත/සහන පොළී මත ණයක් වශයෙන් ප්‍රතිලාභීන් වෙත ලබාදීමේ යෝග්‍යතාවය පිළිබඳව පළාත් සභා බලධාරීන් දැනුම්වත් කරන ලදි. ඒ අනුව, සෑම පළාත් සභාවක් විසින්ම පාහේ 2025 වර්ෂයේ දී සෘජු ප්‍රදානයන් වෙනුවට පොළී රහිත/සහනශීලී පොළිය මත දෙනු ලබන ණය ක්‍රම ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

මෙහිදී සිදුවනුයේ පළාත් සභා බලධාරීන් විසින් ප්‍රාදේශීය ලේකම්වරුන් හා අදාළ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ද සහාය ලබාගෙන තෝරා ගනු ලබන ප්‍රතිලාභීන් සඳහා රාජ්‍ය බැංකුවක් මාර්ගයෙන් එම මුදල් ලබාදීමයි. පළාත් සභාව විසින් අදාළ කාර්යය සඳහා වෙන් කරන ලද මුදල් මූලික ප්‍රාග්ධනය ලෙස ණය දෙන බැංකුවට ලබාදෙන අතර බැංකුවේ පරිපාලන වියදම් වශයෙන් බැංකුව හා එකඟ වූ මුදලක් ලබාදීම ද සිදු කෙරේ. ආපසු ගෙවනු ලබන ණය මුදල් පළාත් සභාවේ මේ කාර්යය සඳහා ස්ථාපිත කරන ලද චක්‍රීය අරමුදලකට බැර කෙරෙන බැවින් මෙම වැඩපිළිවෙළෙහි තිරසර බවද එමගින් රැකේ.

එසේ වුවද පළාත් සභා මගින් මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට බාධාවක් වී ඇත්තේ එම ප්‍රදේශවල ප්‍රතිලාභීන්ට රේඛීය අමාත්‍යාංශ, (මධ්‍යම) රජයේ දෙපාර්තමේන්තු හා මහවැලි අධිකාරිය වැනි ආයතන විසින් එකී විෂයයන්ටම අදාළව (ආපසු අය නොකරන) මූල්‍යාධාර ලබාදීම තුළින් පහත දැක්වෙන අන්දමේ මේ හා සමාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමයි.

(i) කෘෂිකර්ම (රේඛීය) අමාත්‍යාංශය විසින් (කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව) පළතුරු වගාව, දේශීය අලවර්ග, ආරක්ෂිත ගෘහ තුළ වගාව, බිම්මල් වගාව, මී මැසි පාලනය සඳහා 50% රජයේ දායකත්වය යටතේ රු. 500,000ක උපරිම මූල්‍යාධාරයක් ලබාදීම.

(ii) එමෙන්ම, එම අමාත්‍යාංශයේ පශු සම්පත් සංවර්ධනය යටතේ කුකුල් පාලනය (බිත්තර හා මස් පිණිස), කිරි ගව පාලනය, එළු ගොවිපොල පිහිටුවීම වැනි වැඩසටහන් ද සෘජු මුදල් ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කිරීම.

(iii) ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය මගින් ඉහත කී අන්දමේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා උපරිමය රු. 200,000ක සෘජු මුදල් ප්‍රදාන ලබාදීම.

(iv) මහවැලි අධිකාරිය මගින් 50% මූල්‍ය දායකත්වය යටතේ කෘෂි උපකරණ ලබාදීම.

(v) සමෘද්ධි සංවර්ධන වැඩසටහන යටතේ ද 50% දායකත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

මේ අයුරින් එකම ගමකට එකම අන්දමේ ප්‍රතිලාභීන් සඳහා එකම ස්වරූපයේ ආධාර සැපයීම (මධ්‍යම) රජයේ ආයතන විසින් මෙන්ම පළාත් සභා විසින් ද දෙයාකාරයකින් ක්‍රියාත්මක කිරීමේ දී විෂමතාවයක් ඇති වේ. එබඳු තත්වයන් යටතේ පළාත් සභාවේ දායකත්වය සෘජු ප්‍රදානයක් ලෙස නොව පොළී රහිත ණයක්/සහනශීලී පොළිය යටතේ දෙනු ලබන ණයක් ලෙස ලබාදීමේ නව වැඩසටහන් සඳහා මහජනයා සහභාගී කරවා ගැනීම අසීරු වනු ඇත.

එබැවින්, ජීවනෝපාය සංවර්ධනය සඳහා ක්ෂුද්‍ර හා කුඩා පරිමාණයේ ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කෙරෙන ආයෝජන සඳහා උපරිම ඵල ලබාගත හැකි වන අයුරිනුත් ප්‍රතිලාභීන් යැපුම් මානසිකත්වයෙන් ඉවත් කර ව්‍යවසායක මානසිකත්වයකින් කටයුතු කිරීම දිරිමත් කිරීම මගිනුත් තිරසාර සංවර්ධනයක් උදාකරලීමට නම් මේ පිළිබඳව යළි සමාලෝචනය කළ යුතුව ඇත.

එබැවින්, මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කරනු ලබන්නේ ආපසු අය නොකරන ජීවනෝපාය සංවර්ධනය සඳහා කෙරෙන ආධාර පහත සඳහන් කාණ්ඩයන් සඳහා පමණක් ක්‍රියාත්මක කිරීමත් හුදෙක් ආර්ථික කටයුත්තක් ආරම්භ කිරීම පිණිස ලබා දෙන අනෙකුත් සියලුම මූල්‍ය ආධාර, පොළී රහිත/සහනශීලී ණය ක්‍රමයක් යටතේ ප්‍රතිලාභීන් වෙත ලබාදීමත් යෝග්‍ය බවයි.

(i) විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්

(ii) පරිවාසගතව සිට සමාජගත වන පුද්ගලයින්

(iii) දීර්ඝකාලීනව රෝග පීඩා ආදියෙන් පීඩා විඳින පවුල් සඳහා ජීවනෝපාය සැලසීම

(iv) තනිව දරුවන් හදාගන්නා මව්වරුන් (Single Mothers)

(v) විවිධ ක්ෂේත්‍ර යටතේ වෘත්තීය පුහුණුව ලැබූ එම වෘත්තිය පුහුණුව තුළින් පළමුවරට ස්වයංරැකියා සඳහා යොමුවන තරුණ තරුණියන් (ආරම්භක ප්‍රාග්ධනය වෙනුවෙන්)

ඒ අනුව, මෙවැනි වැඩසටහන්/ව්‍යාපෘතිවලට ආධාර ලබාදීමේ දී ජාතික මට්ටමේ හා පළාත් මට්ටමේ ආයතන විසින් ඒකාකාරී ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම යෝග්‍ය වනු ඇත. එබැවින් ඉහත සඳහන් කණ්ඩායම් හැර අනෙකුත් පුද්ගලයින් වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන ක්ෂුද්‍ර ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති හා කුඩා පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු සඳහා රජයෙන් ලබාදෙන දායකත්ව මුදල (පළාත් සභාවන් විසින් ක්‍රියාත්මක කරනු ලබන අන්දමේ) පොළී රහිත/සහනශීලී පොළිය මත දෙනු ලබන ණයක් ලෙස ලබාදීම මැනැවැයි යෝජනා කෙරේ.

**(3) විදේශාධාර මත ක්‍රියාත්මක වන විමධ්‍යගත විෂයයන්ට අදාළ ව්‍යාපෘති වඩාත් උචිත පරිදි සැලසුම් කිරීම**

පළාත් සභාවන්ට පවරා ඇති විෂයයන්ට අදාළ වන බොහෝ විදේශාධාර ව්‍යාපෘති මධ්‍යගත ලෙස සැලසුම් කෙරෙන අතර යෝජිත ව්‍යාපෘති (ඒවායේ පළාත් සංරචකයන් ද ඇතුළුව) ක්‍රියාත්මක කිරීමේ පූර්ණ බලය පළාත් සභාවන්ට නොපවරා එම බලතල අදාළ රේඛීය අමාත්‍යාංශ විසින්ම රඳවා ගන්නා බව නිරීක්ෂණය වේ. 2024 වර්ෂය වන තෙක් පළාත් සභා විශේෂ වියදම් ඒකක වශයෙන් නම් කර නොතිබීම සහ පළාත් ප්‍රධාන ලේකම්වරුන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වශයෙන් පත් කිරීම සිදු නොවීම ඊට එක හේතුවක් විය. මේ අයුරින් ව්‍යාපෘති සැලසුම් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී දක්නට ලැබුණු ප්‍රධාන දුර්වලකම් නම් එකී විදේශාධාර ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති/ක්‍රියාකාරකම් පළාත් සභාවේ වාර්ෂික සංවර්ධන සැලස්ම තුළට ඇතුළු නොවීමත්, ඇතැම් අවස්ථාවලදී එම ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් පළාත් සභාව විසින් හඳුනාගත් ප්‍රමුඛතා නොවීමත් ය.

පළාත් සභා මෙන්ම පළාත් පාලන ආයතන සඳහා අතීතයේදී අයවැයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානය සාපේක්ෂව බෙහෙවින් අඩු වූ බැවින් කුමන මූලයකින් හෝ ලැබෙන මූල්‍යාධාර වැඩිපුර විමසීමකින් තොරව ලබාගැනීමට පළාත් සභා හා පළාත් පාලන ආයතන බලධාරීන් පුරුදුව සිටියහ. බොහෝ රේඛීය අමාත්‍යාංශ විසින් විදේශාධාර ව්‍යාපෘති අදාළ විෂයයන් ක්‍රියාත්මක කිරීම සඳහා මානව සම්පත් හා ධාරිතාවය ඇති පළාත් සභා මගින් ක්‍රියාත්මක කිරීම වෙනුවට රේඛීය අමාත්‍යාංශ විසින් පිහිටුවා ගත් ව්‍යාපෘති කාර්යාල මගින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. බොහෝවිට පළාත් මට්ටමින්ද ව්‍යාපෘති කාර්යාල ඇති කරන ලද අතර පළාත් සභා නිලධාරීන්ට අමතර දීමනා ගෙවමින් එම ව්‍යාපෘති සඳහා සේවයේ යොදවන ලදි. මේ තත්ත්වය යටතේ ඉහළ පරිපාලන වියදමක් දැරීමට සිදු වූ අතර, ව්‍යාපෘතිය නිමාවීමෙන් පසු එමගින් නිමවූ වත්කම්වල වගකීම හෝ එම ව්‍යාපෘතිවලට අදාළ සේවා සැපයීමේ වගකීම නිසි පරිදි භාර ගැනීමට කෙනෙකු නොමැති විය. එකී ව්‍යාපෘති සැලසුම් කිරීමේ ක්‍රියාවලියට මුල සිටම පළාත් සභා සම්බන්ධ කර නොගැනීම හේතුවෙන් එමගින් ඉදි කෙරුණු ප්‍රාග්ධන වත්කම් ඉදි කිරීමෙන් පසුව ඒවා පවත්වාගෙන යාමට අවශ්‍ය මානව සම්පත් පිළිබඳව සහ අඛණ්ඩ සේවා සැපයුමක් සිදු කළ හැකි වන පරිද්දෙන් නිසි ලෙස නඩත්තු කර පවත්වා ගෙන යාම පිළිබඳව මනා සැලසුම්කරණයක් නොවීය.

මේ පිළිබඳව අදාළ බලධාරීන්ගේ අවධානය යොමු කරලීමේ ප්‍රතිඵලයක් ලෙස ලෝක බැංකු මූල්‍යාධාර යටතේ 2004 - 2024 වර්ෂය දක්වා ක්‍රියාත්මක වූ "ප්‍රාථමික සෞඛ්‍ය සේවා ව්‍යාපෘති" සඳහා අදාළ ප්‍රතිපාදන පළාත් සභා වෙත ලබා දී පළාත් සභා බලධාරීන් විසින් පළාත් සභා යාන්ත්‍රණය තුළ බාධාවකින් තොරව ක්‍රියාත්මක කරන ලදි. එසේ වුවද, එම ව්‍යාපෘතියේම දිගුවක් වන "ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය" ("Primary Healthcare Service Enhancing Project - PHSEP") ඒ තත්ත්වයෙන් බැහැරව සැලසුම් කර තිබීම හේතුවෙන් ප්‍රායෝගික දුෂ්කරතා රාශියක් මතු වී ඇත. එම ව්‍යාපෘතියේ පළාත් සංරචකයට අදාළව ක්‍රියාත්මක කළ යුතුව ඇති කුඩා පරිමාණයේ ක්‍රියාකාරකම් විශාල සංඛ්‍යාවක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින්ම ජාතික මට්ටමින් කොන්ත්‍රාත් කළමනාකරණය කර, සියලුම ගෙවීම් රේඛීය අමාත්‍යාංශය විසින්ම සෘජුව සිදු කළ යුතුව ඇත. රේඛීය අමාත්‍යාංශය සතු නොවන වත්කම් මත ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා අමාත්‍යාංශය විසින් ගෙවීම් කිරීමේදී තාක්ෂණික ගැටලුද පැන නගියි. එම තත්ත්වයන් මත එම ව්‍යාපෘතියේ ඇතැම් ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වේ.

ඉහත දුර්වලතා මැනවින් තේරුම්ගෙන සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති "ඒකාබද්ධ සෞඛ්‍ය ආරක්ෂණය සහ පාලනය ශක්තිමත් කිරීම සඳහා වන විශ්ව සෞඛ්‍ය ආවරණ වැඩසටහන 2025-2030" ("Strengthening Integrated Health Care and Governance for Universal Health Coverage Program 2025-2030") ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ සිටම පළාත් සභා සමග මනා සම්බන්ධීකරණයකින් කටයුතු සිදු කර ඇත. එම ව්‍යාපෘතිය යටතේ පළාත් සංරචකයට අදාළ කටයුතු සම්බන්ධයෙන් වූ, ප්‍රසම්පාදන කටයුතු, (ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව) ක්‍රියාත්මක කිරීම පළාත් සභාවට පැවරී ඇත. මෙම ව්‍යාපෘතියේ විශේෂ ලක්ෂණයක් වනුයේ, එය මූල්‍යාධාර ඉඳුරාම ව්‍යාපෘතියට යොමු කිරීමේ ක්‍රමවේදය (Project Support

mode) වෙනුවට පළාත් සභා සැලසුමේ ක්‍රියාකාරකම් වෙනුවෙන් මූල්‍යාධාර හිලව් කිරීම (Budget Support mode) ලෙස ක්‍රියාත්මක වීමයි. මෙම ක්‍රමය තුළ විදේශාධාර ව්‍යාපෘති වඩාත් ඵලදායීව ක්‍රියාත්මක කළ හැකි බව නිරීක්ෂණය වේ.

රේඛීය අමාත්‍යාංශ විසින් ඍජුවම ක්‍රියාත්මක කළ ඇතැම් විදේශාධාර ව්‍යාපෘති යටතේ පළාත් සභාව විසින් හඳුනා ගනු ලැබූ ඉහළ ප්‍රමුඛතාවයන් වෙනුවට අඩු ප්‍රමුඛතාවයෙන් යුතු ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එකී විදේශාධාර යටතේ ඉදිකළ ඉදිකිරීම් බොහෝමයක් ප්‍රයෝජනයට ගත නොහැකි හෝ ඌණ උපයෝජන තත්ත්වයේ ඒවා විය. ඇතැම් එබඳු ව්‍යාපෘති දේශීය අරමුදල්වලින් අඩු පිරිවැයක් යටතේ ඉදිකළ හැකි ඉදිකිරීම් වූවත් (ව්‍යාපෘතිය යටතේ එකී කටයුතුවලට අදාළව සේවයේ යෙදවූ විදේශීය උපදේශකයන්ට කරන ලද ගෙවීම් ආදිය ද ඇතුළත් බැවින්) විදේශාධාර ව්‍යාපෘති යටතේ ඒවා ඉදිකර ඇත්තේ ඉහළම පිරිවැයක් දරමිනි. එබැවින් පළාත් සභාවන්ට අදාළ වන විදේශාධාර ව්‍යාපෘති සැලසුම් කිරීමේදී පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස අදාළ බලධාරීන්ට උපදෙස් දීම මැනවැයි නිර්දේශ කෙරේ.

i. පළාත් සංරචකයක් සහිත විදේශාධාර ව්‍යාපෘති සැලසුම්කරණය කිරීමේදී පළාත් සභාවලට පූර්ණ සහභාගිත්වය ලබා ගැනීම හා සංකූලතා අවම වන මූල්‍ය ප්‍රවාහ ක්‍රමවේදයක් යොදා ගැනීම.

ii. දේශීය අරමුදල් යොදා ගනිමින් අඩු පිරිවැයක් යටතේ ඉදි කළ හැකි වෙළෙඳපොළවල් ඉදිකිරීම්, ග්‍රාමීය මාර්ග, සමිති ශාලා වැනි කුඩා පරිමාණයේ ව්‍යාපෘති/ක්‍රියාකාරකම් විදේශාධාර ව්‍යාපෘතිවලට ඇතුළත් නොකිරීම.

iii. මූල්‍යාධාර ඉඳුරාම ව්‍යාපෘතියට යොමු වන ක්‍රමවේදය (Project Support mode) වෙනුවට හැකිතාක් දුරට සැලසුම්ගත ක්‍රියාකාරකම් වෙනුවෙන් විදේශාධාර හිලව් කිරීමේ ක්‍රමවේදය (Budget Support mode) ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම.

iv. පළාත් සංරචකයට අදාළ ඉදිකිරීම් හා මිළදී ගැනීම් සඳහා (අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ කරගෙන යාමට) පළාත් සභාවන් හට ඉඩ දීම. රේඛීය අමාත්‍යාංශයට එකී බලතල සංකේන්ද්‍රණය කර නොගැනීම.

### (4) ග්‍රාමීය ප්‍රදේශවල සහ වතු වැවිලි ප්‍රදේශවල පිහිටි පාසල් ප්‍රතිසංවිධානය නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම

ග්‍රාමීය හා වතු වැවිලි ප්‍රදේශවල පිහිටි අඩු සිසුන් සංඛ්‍යාවක් සිටින පාසල්වල ඉගෙනුම ලබන ළමුන් හට ගුණාත්මක අධ්‍යාපනයක් නොලැබෙන බැවින් මනා අධ්‍යයනයකින් පසුව එකී පාසල් ඒවාට ආසන්නයේ පිහිටි සාපේක්ෂව පහසුකම් වැඩි පාසල් සමග ඒකාබද්ධ කිරීමේ යෝග්‍යතාව පිළිබඳව මෙම කොමිෂන් සභාව විසින් 2024 වසර වෙනුවෙන් සහ 2025 වසර වෙනුවෙන් ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශවල අවධාරනය කරන ලදි. එබඳු පාසල්වල සිසුන් යාබද වෙනත් පහසුකම් ඇති පාසල්වලට යොමු කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ගරු ජනාධිපතිතුමා විසින් ද අවස්ථා ගණනාවකදී සඳහන් කර ඇත.

උක්ත යෝජනාව වඩාත් යෝග්‍ය පරිදි ක්‍රියාත්මක කිරීමට ඇති අවකාශය අධ්‍යයනය කිරීම සඳහා පළාත් සභා වෙතින් මෑතකදී ලබා ගත් තොරතුරුවලට අනුව දිවයින පුරා සිසුන් 50 ට අඩු පාසල් 1,541 ක් ඇති අතර එම පාසල්වල ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව 45,659ක් ද ඒවායේ සේවය කරන ගුරුභවතුන් සංඛ්‍යාව 8,712ක් ද වේ. ඒවායින් ඇතැම් පාසල්වල පිහිටීම අනුව ප්‍රවාහන දුෂ්කරතා නොමැති, වන අලි උවදුර නොමැති, පාලම් රහිත ගංගා හෝ ගමන් කිරීමට අපහසු භූ විෂමතාවයන් නොමැති ප්‍රදේශයන්හි තවදුරටත් මෙම පාසල් පවත්වාගෙන යාම නිරීක්ෂණය වේ.

අප විසින් රැස්කර ගත් තොරතුරුවලට අනුව, ගමනාගමන දුෂ්කරතා නොමැති කොළඹ දිස්ත්‍රිකයේ නාගරික ප්‍රදේශවලද මෙබඳු කුඩා පාසල් රාශියක් තිබෙන බව තහවුරු විය. ඒ අනුව, කොළඹ කලාපයේ 2 ක්, පිළියන්දල කලාපයේ 8 ක්, ශ්‍රී ජයවර්ධනපුර කලාපයේ 5 ක්, සහ හෝමාගම කලාපයේ 9 ක් බැගින්

එවැනි පාසල් 24 ක් කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. එම පාසල්වල සිසුන් 718 ක් හා ගුරුවරුන් 147ක්ද වෙති. එම පාසල්වලිනුත් කොළඹ කලාපයේ සිසුන් 50ට අඩු පාසලේ සිට පහසුකම් සහිත පාසල දක්වා වන දුර සාමාන්‍යයෙන් කිලෝමීටර 1කට අඩු ය. එම දුර හෝමාගම කලාපයේ පාසල් සම්බන්ධයෙන් බලන කල්හි මීට වඩා මඳක් වැඩි ය. මෙකී කුඩා පාසල් ප්‍රතිසංවිධානයේදී කිසියම් කුඩා පාසලක සිට ඒ ආසන්නයේ පිහිටි පහසුකම් වැඩි පාසල දක්වා ඇති දුර මෙකී ඒකාබද්ධ කිරීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේ එකම සාධකය ලෙස සැලකීම යෝග්‍ය නොවන නමුත් කොළඹ දිස්ත්‍රික්කයේ කුඩා පාසල් සම්බන්ධයෙන් සලකන කල්හි එය ප්‍රධාන සාධකයක් ලෙස සැලකීමට සිදු වේ. කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් සම්බන්ධයෙන් අප විසින් ලබා ගත් තොරතුරුවලින් හෙළිවනුයේ එම දිස්ත්‍රික්කයේ එබඳු පාසල් බොහොමයක්ම සිසුන්ට අපහසුතාවක් ඇති නොවන පරිදි ළඟම ඇති පාසලට ඒකාබද්ධ කිරීම, පහසුවෙන් කළ හැකි බවයි. එබඳු ඒකාබද්ධ කිරීමකදී සිසුන් දැනට ඉගෙනුම ලබන කුඩා පාසලේ සිට ඔවුන් අනුයුක්ත කෙරෙන පාසල දක්වා දුර අනුව එම සිසුන් හට ප්‍රවාහන දීමනාවක් ලබා දීම තුළින් පහසුකම් සහිත වඩා හොඳ අධ්‍යාපනයක් ලැබිය හැකි පාසල්වලට ළමුන් යැවීමට දෙමාපියන් දිරිමත් කළ හැකි වනු ඇත.

කොළඹ දිස්ත්‍රික්කයේ එබඳු සිසුන්ගෙන් 75% කට එවැනි දීමනාවක් ගෙවීමට සිදුවන්නේ යැයි උපකල්පනය කළහොත් එම සංඛ්‍යාව ආසන්න වශයෙන් සිසුන් 540ක් පමණ වේ. ඔවුන්ට ගෙවනු ලබන මාසික දීමනාව රුපියල් 5000ක් නම් ඔවුන් වෙනුවෙන් මාසයකට වැයවෙන සමස්ථ මුදල රු.මිලියන 2.70ක් වනු ඇත. එම මුදල මාසයකට ගුරුවරු 30 දෙනෙකුගේ වැටුපට වඩා අඩු වනු ඇත. කොළඹ දිස්ත්‍රික්කයේ මෙවැනි කුඩා පාසල්වල ගුරුවරුන් 147 ක් සේවය කරන බැවින් එවන් තත්ත්වයක් තුළ එවැනි පාසල් පවත්වාගෙන යාමට දරනු ලබන වියදමට වඩා ඉහත සඳහන් කළ අන්දමේ දිරි දීමනාවන් ගෙවීම සඳහා යන වියදම බොහෝ අඩුවීමට ඉඩ ඇත. තවද, මෙවැනි දිරි දීමනාවන් ගෙවීමට සිදුවන්නේ පළමු වසරේදී පමණක් බව අපගේ වැටහීමයි. තම මුල් පාසලේ මෙන් නොව නව පාසලේ සෑම විෂයයකටම ගුරුවරුන් සිටින නිසා දරුවන් හා දෙමව්පියන් නව පාසලේ වටිනාකම අවබෝධ කරගත් විට දෙමව්පියන් දරුවන් එම පාසල්වලට ස්ව කැමැත්තෙන් යවනු ඇත.

එබැවින්, ඉහත සඳහන් කරන ලද අන්දමේ දිරි දීමනාවන් ලබා දෙමින් මෙම ව්‍යාපෘතිය නියමු ව්‍යාපෘතියක් ලෙස කොළඹ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට මැනවැයි යෝජනා කරමු. එමගින් මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දීමට සිදුවන ප්‍රායෝගික දුෂ්කරතා හඳුනා ගත හැකි බැවින් එකී අත්දැකීම්ද පදනම් කරගනිමින් මෙම වැඩ පිළිවෙල අනෙකුත් පළාත් තුළ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි වනු ඇත.

### (5) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීමේදී මහජන සහභාගීත්වය ලබා ගැනීම.

රජයේ අරමුදල් භාවිතා කරමින් රාජ්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති අපේක්ෂිත ප්‍රමිතියෙන් යුතුව නිම කිරීම සඳහා එම ව්‍යාපෘති නිරන්තර පසු විපරමක් හා අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක විය යුතුය. විශේෂයෙන්ම, මාර්ග ඉදිකිරීම හා නවීකරණය කිරීම, පාලම් බෝක්කු ආදිය ඉදිකිරීම, වාරිමාර්ග පද්ධති ආශ්‍රිත ඉදිකිරීම් මෙන්ම පාසල් හා රෝහල් ආදී පොදු ජනතාවට සේවා සපයන ස්ථාන ආශ්‍රිතව සිදු කරනු ලබන ගොඩනැගිලි ඉදිකිරීම් ආදිය නිසි ප්‍රමිතියට අනුකූලව ඉදිකිරීම පිළිබඳ මනා අධීක්ෂණයක් තිබිය යුතුය. කෙසේ වෙතත්, පසුගිය වසරවල මෙසේ ඉදිකරන ලද විවිධ ඉදිකිරීම් නිසි ප්‍රමිතියට අනුව ඉදි නොකෙරුණු අවස්ථා වාර්තා වූ අතර ඒහේතුවෙන් පොදු ජනතාව විවිධ දුෂ්කරතාවලට මුහුණ දුන් අතරම මහජන මුදල් විශාල වශයෙන් අපතේ යාම ද සිදු විය. මෙම තත්ත්වය සම්බන්ධයෙන් 2025.04.10 දින පවත්වන ලද රාජ්‍ය මුදල් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා කමිටුවේ දී ද අවධානය යොමු විය.

මෙම තත්ත්වය වළක්වා ගනිමින් අපේක්ෂිත ප්‍රමිතියට මෙම ඉදිකිරීම් සිදු කළ හැකි වඩාත්ම උචිත ක්‍රමවේදය වන්නේ එම කාර්යය සඳහා වගකීම පැවරී ඇති නිලධාරීන් විසින් එම ඉදිකිරීම් නිරන්තර අධීක්ෂණයට ලක් කිරීම වුවද, පවතින නිලධාරී හිඟය හා පහසුකම් හිඟය මෙන්ම, එසේ නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම සඳහා ඇති ව්‍යාපෘති සංඛ්‍යාව ඉතා විශාල වීම ආදී හේතු නිසා එම නිලධාරීන්ට සෑම ව්‍යාපෘතියක්ම එසේ සමීපව අධීක්ෂණය කිරීම ප්‍රායෝගිකව අපහසු වී ඇත.

මේ තත්ත්වය නිවැරදි කිරීමට ඇති එක් ක්‍රියාමාර්ගයක් නම්, අදාළ නිලධාරීන් විසින් එකී ව්‍යාපෘති අධීක්ෂණය කිරීමට අතිරේකව එක් එක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන ප්‍රදේශයේ මහජනතාවට මෙන්ම මහජන නියෝජිතයින්ට අදාළ ඉදිකිරීම් කටයුතු ගැන විමසිලිමත්ව සිටීමට අවස්ථාව සලසාදීම බව නිරීක්ෂණය විය. එබැවින්, පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති/ක්‍රියාකාරකම් සඳහා අත්හදා බැලීමක් වශයෙන් මෙම ක්‍රමය යොදා ගන්නා ලෙස ප්‍රධාන ලේකම්වරුන්ට උපදෙස් දීම යෝග්‍ය බව මුදල් කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදි. ඒ අනුව, පළාත් සභාවේ විවිධ ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රමාණ පත්‍ර (BOQ) මහජනතාවට පහසුවෙන් කියවා තේරුම් ගත හැකි පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ප්‍රදේශ ආශ්‍රිතව ප්‍රදර්ශනය කරන ලෙසත්, මහජනතාව විසින් එම ව්‍යාපෘතිවලට අදාළ ප්‍රමාණ පත්‍ර පිළිබඳව යම් තොරතුරක් ඉල්ලා සිටින අවස්ථාවක එම තොරතුරු පහත දැක්වෙන පරිදි අවශ්‍ය සෑම විටකම ලබා දෙන ලෙස අදාළ නිළධාරීන්ට උපදෙස් දෙන ලෙසත් මුදල් කොමිෂන් සභාව විසින් 2025.05.05 දිනැති ලිපියෙන් පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත දන්වා යවන ලදි.

i. අවශ්‍ය අයෙකුට අදාළ ප්‍රමාණ පත්‍ර වැඩබිම තුළ දී පරීක්ෂා කර බැලීමට ඉඩ දීම.

ii. අවශ්‍ය අයෙකුට එම ප්‍රමාණ පත්‍රවල ඡායාරූප ලබා ගැනීමට ඉඩ ලබා දීම.

iii. පළාත් සභාවේ නිශ්චිත වෙබ් අඩවියක එම ප්‍රමාණ පත්‍ර ප්‍රදර්ශනය කිරීම හා ප්‍රමාණ පත්‍ර ලබා ගත හැකි වෙබ් අඩවියට පිවිසෙන අයුරු ලැමිනේට් කරන ලද පත්‍රිකාවක වැඩ බිමට පිවිසෙන ස්ථානයේ ප්‍රදර්ශනය කිරීම මෙන්ම අවශ්‍ය ඕනෑම අවස්ථාවක ප්‍රමාණ පත්‍ර ඉල්ලා සිටින අයෙකුට එම ප්‍රමාණ පත්‍ර ලබාදීමට වැඩපිළිවෙළක් ද හඳුන්වා දීම.

අපට දැන ගන්නට ලැබී ඇති තොරතුරු අනුව මෙම උපදෙස් සෑම පළාතකම ක්‍රියාත්මක වේ. ජාතික පුවත්පත්වල පළ වූ වාර්තා හා සමාජ මාධ්‍යවල පළවූ ප්‍රතිචාරවලින් පෙනී යන්නේ මෙම වැඩපිළිවෙල මහජනතාවගේ ඇගයීමට ලක්වන බවයි.

එබැවින්, රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති/ක්‍රියාකාරකම් පසු විපරම් කිරීමේදී මහජන සහභාගීත්වය ලබා ගැනීම සඳහා පළාත් සභා යටතේ ඇති ආයතන විසින් තම ආයතනයෙන් සිදු කෙරෙන ඉදි කිරීම්වලට අදාළ ප්‍රමාණපත්‍ර (BOQ) හා අනෙකුත් අදාළ තොරතුරු ප්‍රතිලාභීන්, සමාජ ක්‍රියාකාරීන්, දේශපාලන නායකත්ව හා සිවිල් සංවිධාන ආදී උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ලබා ගැනීමට පහසුකම් සැලසීම සඳහා පළාත් සභා විසින් ගනු ලැබූ සාර්ථක උත්සාහය සැළකිල්ලට ගනිමින් මහජනතාවට පහසුවෙන් වැටහෙන පරිදි ප්‍රමාණ පත්‍ර හා ඉදිකිරීමට අදාළ මූලික තොරතුරු මහජනතාවට ලබාගැනීමට පහසුකම් සැලසීම සියලුම රාජ්‍ය ආයතන විසින් අනිවාර්යයෙන්ම සිදු කළ යුතු බවට, සියලුම රාජ්‍ය ආයතන වෙත උපදෙස් ලබා දීම මැනවැයි නිර්දේශ කෙරේ.

### (6) පරිවාසගත දරුවන් රැකබලා ගැනීමේ කාර්යමණ්ඩල අවශ්‍යතාව

විවිධ හේතූන් මත දෙමව්පිය රැකවරණය නොලබන අනාථ ළමුන් මෙන්ම ළමා වරදකරුවන්ද රැක බලා ගැනීම පළාත් සභාව යටතේ ගැනෙන පරිවාස දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන විවිධ රැකවරණ මධ්‍යස්ථානවලින් ඉටු වේ. ප්‍රමාණවත් තරම් අරමුදල් නොලැබුණු පසුබිමක එකී ආයතනගත ළමුන් පිළිබඳව කාලයක් තිස්සේ අවශ්‍ය අවධානය යොමු නොවීම හේතුවෙන් එකී ආයතනවලට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් නොවීම පිළිබඳව මෙම කොමිෂන් සභාව විසින් පසුගිය වසරේ ඉදිරිපත් කළ වාර්තාවේ 5 වන පරිච්ඡේදයේ 10 වන නිර්දේශය යටතේ දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කරන ලදි. ඒ අනුව, එකී ආයතනවලට අවශ්‍ය ගොඩනැගිලි හා භෞතික පහසුකම් ලබා දීමත් ප්‍රවාහන පහසුකම් සැලසීම සම්බන්ධයෙනුත් එකී ළමුන්ගේ වයස සම්පූර්ණ වීම මත සමාජගත කිරීමට පහසුකම් සැලසීම සම්බන්ධයෙනුත් 2025 වර්ෂය සඳහා වූ අයවැය යෝජනා මගින් සහන රාශියක් සලසා තිබීම හේතුවෙන් අපගේ එකී නිර්දේශයේ (iii), (iv), (vi), (vii) හා (viii) හි සඳහන් වූ අවශ්‍යතා අපේක්ෂිත මට්ටමටත් වඩා ඉහළින් සපුරා ඇති බව කෘතවේදීව සඳහන් කරමු.

එසේ වුවද, එකී යෝජනා මාලාවේ (ii) යටතේ සඳහන් වූ ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොමැති වීමේ ගැටළුව තවමත් බරපතළ ප්‍රශ්නයක් වී ඇති බව නිරීක්ෂණය කරමු. වෘත්තිමය සුදුසුකම් හා මනා පළපුරුද්දක් සහිත නිවාස පාලිකා වැනි නිලධාරින් විසින් ඉටු කළ යුතු කාර්යයන් එබඳු කිසිඳු පුහුණුවක් නොමැති කණිෂ්ඨ සේවක පිරිස් විසින් ඉටු කිරීම මෙම ආයතනවල නේවාසික දරු දැරියන් හට ඉතා හානිකර ලෙස බලපාන බවද අප එහි සඳහන් කළෙමු. කාර්යමණ්ඩලයේ අනෙකුත් තනතුරු විශාල වශයෙන් පුරප්පාඩුව තිබීම මේ ආයතන පවත්වාගෙන යාමේදී මුහුණදෙන ගැටළුවක් වන අතර දැනට සේවයේ නියුතු පිරිස් දැඩි පීඩනයකින් කටයුතු කරන බවද හෙළි වී ඇත. පසුගිය වසර පහක පමණ කාලයක් තුළ රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම අත්හිටුවා තිබීමත්, රජය විසින් අනුගමනය කළ එම ප්‍රතිපත්තිය පොදුවේ සෑම අංශයකටම එකසේ ක්‍රියාත්මක වීමත් හේතුවෙන් පරිවාස දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය ද විශාල වශයෙන් අඩු විය. එම තත්ත්වය දරුවන්ට රැකවරණය ලබා දෙන මධ්‍යස්ථානවලට සහ සහතික කළ පාසල්වලට දැඩි බලපෑමක් ඇති කර තිබේ. එමගින් පරිවාසගත වී සිටින දරුවන්ට අත්‍යවශ්‍ය සේවා සැපයීම අඩාල වී තිබේ.

මෙම තත්ත්වය තුළ ඉතාමත් සංවේදී හා අත්‍යවශ්‍ය සේවාවක් ඉටු කරනු ලබන පළාත් පරිවාස දෙපාර්තමේන්තුවට එකී කාර්යභාරය ඉටු කිරීමට අපහසුතාවයන් ඇති වී ඇති අතර, එමගින් පරිවාසගතව සිටින එක් දිනක් වයසැති දරුවාගේ සිට වයස අවුරුදු 18 දක්වා දරුවන්ගේ සුභසාධනය විශාල ලෙස පිරිහීමකට ලක්වී ඇත. සේවක හිඟය නිසා කුඩා දරුවන් රැක බලා ගැනීම උදෙසා ඔවුන් කුඩා ඉඩකඩක කොටු කර තැබීම, ඔවුන් නිසි පරිදි පිරිසිදු නොකිරීම, ඔවුන්ට අවශ්‍ය පෝෂණ අවශ්‍යතා නිසිවෙලාවට සපුරාලීමට නොහැකි වීම, රෝගී වූ දරුවන් කෙරෙහි අවශ්‍ය අවධානය යොමු කිරීමට නොහැකි වීම, ඔවුන්ගේ අධ්‍යාපන හා පුහුණුවීම් කටයුතු අඩාල වීම මෙන්ම ඔවුන්ට නිසි ආරක්ෂාව සැපයීමට අපහසුවීම වැනි අසතුටුදායක තත්ත්වයන් නිර්මාණය වී ඇති අතර, අනාරක්ෂිතභාවයට පත්වීම ද සිදුව තිබේ.

මේ තත්ත්වය යටතේ පරිවාස දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය සේවක සංඛ්‍යාව ලබා දීමට විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. එබැවින්, දැනට කරගෙන යනු ලබන කාර්යමණ්ඩල සමාලෝචනය අවසන් වන තෙක් නොසිට පළාත් පරිවාස දෙපාර්තමේන්තු සඳහා අවශ්‍ය තනතුරු ඇති කිරීමටත් පුරප්පාඩු වී ඇති තනතුරු පිරවීමටත් අදාළ බලධාරීන්ට උපදෙස් දීම මැනවැයි කොමිෂන් සභාව විසින් නිර්දේශ කෙරේ.

ඇමුණුම I

**කොමිෂන් සභාව විසින් යෝජනා කරනු ලබන පරිදි අපේක්ෂිත ආදායම් ඉලක්කයෙන් 50% ගැළපීමෙන් පසුව නිර්දේශිත පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන පළාත් අතර බෙදා වෙන් කිරීම - 2026**

(රු.මි.)

| අනු අංකය | පළාත | සංයුක්ත දර්ශකය අනුව ප්‍රාග්ධන ප්‍රදානයේ පළාත් ප්‍රතිශතය (%) | නිර්දේශිත මුළු පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 2026 වර්ෂයේ ආදායම් ඉලක්කය | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සමඟ ගළපන ලද ආදායම | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සමඟ ගළපන ලද ආදායම් ඉලක්කයේ ප්‍රතිශතය | සාමූහික ප්‍රදාන සමඟ ගළපන ලද ආදායම | ආදායම් ගැළපීමෙන් පසු නිර්දේශිත පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානය |
|---|---|---|---|---|---|---|---|---|
| | **1** | **2** | **3** | **4** | **5** | **6 = 5/4*100** | **7 = 4-5** | **8 = 3-5** |
| 1 | බස්නාහිර | 9.24 | 12,197.00 | 13,900.00 | 2,430.00 | 17.48 | 11,470.00 | 9,767.00 |
| 2 | මධ්‍යම | 11.43 | 15,088.00 | 2,750.00 | 2,111.00 | 76.76 | 639.00 | 12,977.00 |
| 3 | දකුණු | 10.97 | 14,480.00 | 3,425.00 | 2,065.00 | 60.29 | 1,360.00 | 12,415.00 |
| 4 | උතුරු | 11.46 | 15,127.00 | 1,700.00 | 1,563.00 | 91.94 | 137.00 | 13,564.00 |
| 5 | වයඹ | 10.89 | 14,375.00 | 4,580.00 | 2,233.00 | 48.76 | 2,347.00 | 12,142.00 |
| 6 | උතුරු මැද | 11.28 | 14,889.00 | 2,751.00 | 2,054.00 | 74.66 | 697.00 | 12,835.00 |
| 7 | ඌව | 11.89 | 15,695.00 | 1,520.00 | 1,498.00 | 98.55 | 22.00 | 14,197.00 |
| 8 | සබරගමුව | 11.55 | 15,246.00 | 2,775.00 | 2,095.00 | 75.49 | 680.00 | 13,151.00 |
| 9 | නැගෙනහිර | 11.29 | 14,903.00 | 1,303.50 | 1,303.50 | 100 | - | 13,599.50 |
| | එකතුව | **100** | **132,000.00** | **34,704.50** | **17,352.50** | **50** | **17,352.00** | **114,647.50** |

මුදල් කොමිෂන් සභාව
(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 "ඊ" ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදී)
நிதி ஆணைக்குழு
(அரசியலமைப்பின் 154 "ஊ" ஆம் உறுப்புரையின் கீழ் தாபிக்கப்பட்டது)
FINANCE COMMISSION
(Established under Article 154 "R" of the Constitution)

03, සරණ මාවත,
රාජගිරිය, ශ්‍රී ලංකාව.

இல. 03, சரண மாவத்தை,
ராஜகிரிய, இலங்கை.

03, Sarana Mawatha,
Rajagiriya, Sri Lanka.

ඇමුණුම **II**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | FC/PDP/01/01/2026 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 07.10.2025 |

Chief Secretary
Western Province

**<u>Guidelines for the Preparation of the Provincial Annual Development Plan-2026</u>**

**01. Issuing of Guidelines for the year 2026 in Advance**

The following guidelines are issued this year well in advance with the intention of expediting the planning process of the Provincial Annual Development Plan (ADP) for the ensuing year (2026). It is expected that this arrangement will help to avoid the possible delays experienced in the past in the preparation of the ADP by Provincial Councils, as the availability of funds was communicated in the past only after the passage of the Appropriation Bill for the following year.

**02. Availability of Capital Grants for the Year 2026**

Estimated budgetary provisions for all spending agencies, including the Provincial Councils, have been stated in the Appropriation Bill for the ensuing year, which was published in the Gazette dated 17.09.2025. These figures cannot be considered as final provisions until those are approved by Parliament, which has full control over public finance. Since the amounts specified in the Appropriation Bill for the year 2026 are based on the "binding ceiling" fixed in terms of Section 15 of the Public Financial Management Act No. 44 of 2024, it has become possible to communicate these figures this time with more certainty for the use in the preparation of the Annual Development Plan unlike in the past.

Therefore, based on the information available in the said Appropriation Bill, as well as the information obtained from the General Treasury, the tentative amounts of capital grants available for the year 2026 to your Province are as follows:

| | | Rs.mn |
|---|---|---|
| I. | Provincial Specific Development Grant (PSDG) | 6,403 |
| II. | Criteria Based Grant (CBG) | 600 |
| III. | Foreign Funded Projects and Locally Funded Special Projects | 997 |
| IV. | Total Capital Grant | 8,000 |

Accordingly, you are kindly requested to prepare the ADP for PSDG based on the tentative amount of Rs.6,403million. The sectoral breakdown of the PSDG is attached as **Annex 1**.

Please note that these figures are provisional and may be subject to adjustment after the approval of the Appropriation Bill by Parliament.

සභාපති
தலைவர்
Chairman (+94)011 2866724

ලේකම්
செயலாளர்
Secretary (+94)011 2866824

කාර්යාලය
அலுவலகம்
Office (+94)011 2866747

ෆැක්ස්
தொலைநகல்
Fax (+94)011 2866679

වෙබ් අඩවිය
இணையத்தளம்
Website www.fincom.gov.lk

විද්‍යුත් තැපෑල
மின்னஞ்சல்
E-mail info@fincom.gov.lk

## 03. Overall Guidance

In the preparation of the Annual Development Plan, you are expected to be guided by the following matters.

a. List of devolved subjects as specified in the Provincial List of the Ninth Schedule of the Constitution.
b. The National Policy Framework “A Thriving Nation- A Beautiful Life” approved by the Cabinet on 03.03.2025
c. National Budget Circular No. 02/2025 (Budget Call-2026) - Guidelines for the preparation of Annual Budget Estimate -2026 dated 30.06.2025 issued by the Secretary to the Treasury
d. Sustainable Development Goals
e. Critical development needs of the Province
f. Medium Term Development Plan of your Province
g. Intra-regional disparities including disadvantaged groups

## 04. Ensuring the Efficient Use of Funds through Proper Planning

In order to derive the maximum benefits from the limited funds made available to Provincial Councils, such funds must be used prudently as has been repeatedly stated in the past. The renewed emphasis on the need for the management of public funds efficiently, effectively, and economically while improving transparency and fiscal responsibility has been made through the enactment of the Public Financial Management Act No. 44 of 2024.

As provided under Section 62(1) of the said Act, Provincial Councils and Local Authorities are required to adhere to the principles of transparency and fiscal responsibility stipulated in the Act, subject to the provisions of the Constitution and other relevant written laws. The Finance Commission observes that the Provincial Financial Rules provide a very sound governance framework including planning methodology which are embodied in the said Act.

Therefore, you are urged to ensure the followings:

I. Ensure proper functioning of Provincial Ministerial Planning Units referred to in the Provincial FR 4.2.4 and the Provincial Planning Committee referred to in Provincial FR 80.1, and also the Provincial Planning Department referred to in Provincial FR 79.3 and in Schedule 5 of the Provincial FR.

II. All project proposals on development activities/projects that are expected to be included in the ADP of the Province must be appraised before being incorporated, in accordance with Provincial FR 4.2.2 and 4.2.3. With regard to the projects which are acceptable after the preliminary appraisal, action should be pursued as stipulated in the Provincial FR 4.2.3.

III. Accordingly, all project proposals should undergo a preliminary appraisal by the Planning Division of each respective Provincial Ministry, as stipulated in Provincial FR 4.2.3 and further detailed appraisal by the Deputy Chief Secretary (Planning) as necessary taking also into consideration (V) below.

IV. Ensure that appraisal of projects/activities is carried out taking into consideration as to whether the projects/activities:

a) are in line with Sri Lanka’s National Policy Framework approved by the Cabinet on 03.03.2025
b) adhere to the stipulations in the National Budget Circular No. 02/2025
c) are well within the Agenda 2030 on Sustainable Development Goals
d) reflect the felt needs of the region/district/Province
e) are the topmost priorities within the sector
f) derive maximum benefits to a larger number of people in the community
g) ensure value for money
h) can be commenced without delay in terms of the project preparedness
i) can be implemented in an integrated manner in order to harness the synergies of other sectors.

V. In undertaking the detailed appraisal, the relevant planning authority can decide whether the cost-benefit analysis should be conducted in respect of projects/activities on small scale common assets such as rural roads, irrigation structures, service providing constructions, if (a) – (i) of (IV) above are satisfied.

## 05. General Guidelines

As previously mentioned, it is imperative to ensure the prudent and well-planned utilization of the limited budgetary allocations available especially for capital investments. Therefore, all Provinces should give priority on designing projects that directly contribute to the economic development and improvement of living conditions of the people in the Province through employment creations and income generations. Accordingly, the Finance Commission has directed me to request you to pay due attention to the following key areas as well in the preparation of the Provincial Annual Development Plan for the year 2026 in your Province.

### 5.1 Financial Governance

i. Provincial Councils should adhere to the relevant rules, regulations, and circulars issued from time to time by the Government and to comply with the rules and regulations of respective Provincial Councils to ensure proper financial management at the sub-national level.

ii. Provincial authorities are responsible for adopting government procurement procedures in the implementation of development plans. Therefore, you are requested to follow the common rules and regulations of the government to ensure uniformity between National and sub-national level expenditure management.

### 5.2 Strategic Planning and prioritization

i. The Annual Development Plan has to be based on the Master Plans which need to be developed for major sectors recognizing the sectoral priorities spelt out in the National Policy Framework approved by the Cabinet on 03.03.2025 and those referred to in the guidelines sent to you last year by my letter no. FC/PDP/01/01/2025 dated 29.12.2024 to avoid haphazard development activities. (Please see 06 below)

ii. Resource mapping exercises need to be carried out on a sectoral basis with a view to tapping regional/ locational advantages and diverting resources to the disadvantaged groups/ localities.

iii. Before committing funds for projects, their feasibility, quality/standards and maintenance aspects and future cost should be given due consideration.

iv. Based on logical need assessment, prioritization of projects is very important to optimal utilization of resources determining outcomes while promoting allocative efficiency of limited funds.

v. In case, the completion of a project exceeding one year, it needs to be phased out properly indicating funding requirement for the ensuing years. In doing so, the success of previous stages should be properly reviewed before commencing the later stages of the project.

vi. When creating common assets, due attention should be paid to lagging areas.

vii. Integrated development approach should be adhered to as a policy within the Provincial Council by coordinating relevant government and non-governmental organizations to avoid duplications and overlapping of activities.

viii. Paying due attention to cross-cutting subjects such as commercial and trading enterprises, environment, disaster prevention, women affairs and youth affair to incorporate them in all development sectors since they have to be addressed through an integrated manner.

ix. Areas lagging behind in relation to socio economic indicators have to be identified and root causes of issues need to be addressed with fair distribution of funds for those areas with a view to minimize intra-regional disparities.

x. The relevant projects need to be designed in alignment with the National Physical Plan of Sri Lanka.

xi. Priority should be given to the development of physical infrastructure essential for the public.

xii. Keeping an appropriate portion of funds in each sector is required to meet unexpected expenditures pertaining to provision of useful services. (e.g. urgent renovation, rehabilitation)

xiii. Accordingly, the Provincial Annual Sectoral Plans should be prepared for the following 23 sectors as per the prescribed Forms 3, 3a which are used for the preparation of ADPs.

1. Education
2. Western Medicine
3. Indigenous Medicine
4. Provincial Roads
5. Irrigation
6. Agriculture
7. Livestock Development
8. Inland Fisheries
9. Small Industries
10. Sports
11. Probation and Childcare
12. Social Services
13. Cultural Affairs
14. Co-operative Development
15. Early childhood Development
16. Estate Infrastructure
17. Transport
18. Housing
19. Rural Electrification (within the scope of item no. 34 of the Provincial List)
20. Local Government
21. Tourism
22. Rural Development
23. Land Development

xiv. In addition to the allocations for the above sectors under PSDG, an amount has been earmarked as the flexible allocation that can be used for special development projects, completion of already started special development projects and urgent requirement of development nature which are not anticipated in the original plans. If you intend to implement special development projects for the year 2026, relevant project proposals should be prepared for the identified development projects with information of relevant feasibility studies and submit to the Finance Commission for the concurrence. The Guidelines on preparation of special development projects will be issued in due course.

### 5.3. Inclusive Development and Social Equity

i. Participation of beneficiaries especially the youth in the area should be ensured in the identification and implementation of projects/ activities giving opportunities for integrated planning, social auditing and transparency.

ii. Paying due attention to SDG 5 (indicator 5.C.1), projects need to be identified to promote women's participation in the labor force through sufficient gender responsive budgeting and women's empowerment and leadership. Accordingly, at least 25% of allocation has to be made available for projects directly benefiting women from the projects implemented for Rural Economic Development within the government policy framework. Wherever applicable, Provincial Authorities need to maintain gender-disaggregated budget details for further analysis.

iii. Provincial Authorities need to pay attention to the Multi-Sectoral Framework "National Action Plan for Disabled (NAPD) in Sri Lanka" for empowering differently-abled persons. Hence, a fair contribution has to be ensured to implement the NAPD paying special attention to improving the accessibility for people with disabilities adhering to Disabled Persons (Accessibility) Regulations, No.01 of 2006.

### 5.4. Climate Resilience and Sustainable Development

i. Sri Lanka, as a Member State of the United Nations, adopted the Agenda 2030 for Sustainable Development, which comprises 17 Goals and 169 Targets. The adoption of the Agenda commits Sri Lanka to a universal, transformative, inclusive, and integrated framework of sustainable development with the overall pledge of "leaving no one behind". The Provincial Council should also adhere to the Agenda 2030 which constitute the overarching framework for an integrated approach to sustainable development.

ii. At the Paris Climate Conference (COP21) in December 2015, 195 countries including Sri Lanka adopted the first-ever universal, legally binding global climate deal. Accordingly, the Provinces have to adopt the key elements of the Paris Agreement while paying attention to scaling up their efforts and support actions to reduce emissions, build resilience and decrease vulnerability to the adverse effects of climate change.

iii. The Provincial Council is required to systematically identify expenditure components related to climate risk reduction, disaster response, mitigation, adaptation, and management of potential climate-related risks under its purview. Provincial ADPs shall therefore incorporate projects and activities that address these vulnerabilities, to minimize the impact of climate change and enhance community resilience.

### 5.5 Efficient Resource Management

i. Allocations provided under PSDG and CBG, firstly should be utilized for the settlement of bills in hand if any. Therefore, the funds should be allocated to complete the activities already started in 2025 or before which have not been completed, in order that such assets created could be effectively utilized. Accordingly, the List of activities prepared in advance could be curtailed to meet such cost. Details of Bills in Hand and Continuations have to be submitted to the Finance Commission by 15.01.2026 as per the Form 4.

ii. The Province needs to take every effort to complete the programs/ projects as planned out during the financial year of 2026.

iii. Idled capital assets belonging to the Provincial Councils and Local Authorities have to be transformed into productive assets focusing promotion of local productions through relevant agreements preferably with the private sector. Possible ways and means have to be identified to use such assets without further investing government funds on them.

iv. If possible, the financial contribution of the relevant stakeholders (e.g.: Local Authorities, NGOs, CBOs etc.) could be taken into account to reduce the burden on the government budget.

v. In estimating the cost of infrastructure/ construction nature projects, the cost of all components which are required to generate desired output should be considered. Irrational "packaging" of the project/ activity to circumvent the limits imposed in the Procurement Guidelines should be avoided as it leads to the creation of incomplete assets leading to wastages of scarce resources.

vi. Proper estimation of the project is the most important step in the process. The total budgetary requirement to complete the project during the entire project period should be indicated as the Total Estimated Cost (TEC), whereas, only the cost to be incurred during the year 1 should be shown under the current year budget.

vii. The practice of providing government assistance in the form of concessionary loans in place of 50% outright grants given for income generating projects/ activities hitherto should be pursued vigorously. Therefore, you are requested to introduce an appropriate loan scheme in place of 50% government contribution given as a grant. However, if pilot projects are to be implemented to demonstrate a new technology or practices, Provincial Councils could bear a certain percentage of the cost to minimize the risk.

viii. Outright grants may be confined to sectors such as Probation and childcare, Social Services which cater especially to vulnerable and marginalized groups in the society.

ix. For economic infrastructure projects excluding those referred to in (v) of Section 4 above, cost-benefit analysis should be conducted while applying the cost-effective principle for social infrastructure projects

**5.6 Monitoring and Evaluation**

i. A proper monitoring mechanism should be established to monitor the implementation and quality of the output of all projects/ activities implemented by the Provincial agencies as stipulated in the Provincial FR 5.5, 76.2.9 and 4.2.4(ඊ). It is recommended to adopt a Management Information System (MIS) for the purpose of regular monitoring and upgrade the existing system to meet the present requirements as necessary.

ii. Bill of Quantities and other basic information should be made available in an appropriate manner for the information of beneficiaries to ensure the active participation in the monitoring of relevant constructions/ rehabilitation as communicated to you by my letter No. FC/PDP/01/01/2025-II dated 05.05.2025.

iii. The results and impacts of projects and activities should be evaluated to determine the extent to which their objectives have been achieved. The Province shall formulate an appropriate methodology for evaluation process.

iv. Data and information related to the Development Plans and its progress need to be made available for relevant organizations to facilitate the development of policies, and designing of programs/ projects through relevant studies.

**06. Application of the Guidelines of 2025 for 2026**

All the matters referred to in the Section 4 (Sectoral Priorities) and onwards in the guidelines on the preparation of ADP-2025 issued by my letter number FC/PDP/01/01/2025 dated 29.12.2024 will remain in effect for the preparation of the Annual Development Plans for 2026 as well. Accordingly, Sectoral Priorities of each sector mentioned above, methodology of preparation of the Annual Development Plan, Provincial Planning Framework (including sector component, and sub components) and annexures referred in the last year guidelines will be effective for the purpose of ADP preparation for 2026. Therefore, you are required to adhere to those guidelines and include all the necessary information in your Provincial ADPs - 2026.

**07. Deadline for submission of ADP**

In order to facilitate the Provincial Councils to implement their Annual Development Plans from the beginning of the year 2026 without delay, the Finance Commission intends to conduct the ADP review meeting well in advance probably during first two weeks of December, 2025. Therefore, you are kindly requested

(a) to prepare Annual Development Plan of your Province for the year 2026 and submit 2 hard copies as well as a soft copy (email: info@fincom.gov.lk) of the same to the Finance Commission Office on or before **15th of November 2025.**

(b) to include an endorsement in the covering letter to the effect that the ADP has been prepared in accordance with the above guidelines.

**08.** These Guidelines are issued as per the directions given by the Finance Commission.

Your cooperation in this regard is highly appreciated.

A.T.M.U.D.B. Tennakoon
Secretary
Finance Commission

Copies:

1. Secretary to the President, Presidential Secretariat - For information please
2. Secretary to the Prime Minister, Prime Minister's Office - For information please
3. Secretary, Ministry of Finance, Planning & Economic Development - For information please
4. Secretary, Ministry of Public Administration, Provincial Councils and Local Government. - For information please
5. Auditor General, Department of Auditor General - For information please
6. Deputy Secretary to the Treasury, General Treasury - For information please
7. Director General, Department of National Budget - For information please
8. Director General, Department of National Planning - For information please
9. Deputy Chief Secretary (Planning), Western Province - For necessary action please
10. Deputy Chief Secretary (Finance), Western Province - For necessary action please
11. Assistant Auditor General, Western Province - For information please

Annex 1

## The tentative amount of Provincial Capital Fund Allocation - 2026
## Western Province

| No. | Sector | Amount (Rs.Mn) |
|---|---|---|
| **1** | **Social Infrastructure** | **3,017** |
| 1.1 | Education | 1,125 |
| 1.2 | Western Medicine | 1,100 |
| 1.3 | Indigenous Medicine | 213 |
| 1.4 | Sports | 73 |
| 1.5 | Probation and Childcare | 249 |
| 1.6 | Social Services | 131 |
| 1.7 | Cultural Affairs | 40 |
| 1.8 | Housing | 40 |
| 1.9 | Co-operative | 9 |
| 1.10 | Early Childhood Development | 37 |
| **2** | **Economic Infrastructure** | **3,075** |
| 2.1 | Provincial Roads | 1,277 |
| 2.2 | Estate infrastructure | 91 |
| 2.3 | Transport | 61 |
| 2.4 | Land | 10 |
| 2.5 | Agriculture | 304 |
| 2.6 | Livestock | 219 |
| 2.7 | Inland Fisheries | 37 |
| 2.8 | Irrigation | 255 |
| 2.9 | Rural Development | 76 |
| 2.10 | Small Industries | 91 |
| 2.11 | Rural Electrification | 12 |
| 2.12 | Tourism | 88 |
| 2.13 | Local Government | 554 |
| | 2.13.1.Local Authority Roads | 274 |
| | 2.13.2.Community Water Supply | 67 |
| | 2.13.3.Waste Management | 134 |
| | 2.13.4.Other Services | 79 |
| | **Sub Total** | **6,092** |
| **3** | **Projects under Flexible Amount & Special Development Projects** | **311** |
| **Total Provincial Specific Development Grant (PSDG)** | | **6,403** |

**We submit the foregoing recommendations for your highest consideration.**

සුමිත් අබේසිංහ

සභාපති

சுமித் அபேசிங்ஹ

தலைவர்

**Sumith Abeysinghe**

**Chairman**

ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ

නිල බලයෙන් පත් වූ සාමාජික (ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති )

கலாநிதி பி.நந்தலால் வீரசிங்ஹ

பதவி வழி அங்கத்தவர் (இலங்கை மத்திய வங்கி ஆளுநர்)

**Dr. P. Nandalal Weerasinghe**

**Member (Ex-officio) (Governor of the Central Bank of Sri Lanka)**

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම

නිල බලයෙන් පත් වූ සාමාජික (මහා භාණ්ඩාගාරයේ ලේකම්)

கலாநிதி ஹர்ஷண சூரியப்பெரும

பதவி வழி அங்கத்தவர் (திறைசேரியின் செயலாளர்)

**Dr. Harshana Suriyapperuma**

**Member (Ex-officio) (Secretary to the Treasury)**

එම්. වාමදේවන්

පත්කළ සාමාජික

எம்.வாமதேவன்

நியமன அங்கத்தவர்

**M. Vamadevan**

**Member (Appointed)**

ටී. නලීන් ඔෂෙන්

පත්කළ සාමාජික

டீ.நலீன் ஒஸென்

நியமன அங்கத்தவர்

**T. Naleen Ossen**

**Member (Appointed)**